අ.පො.ස (සා.පෙළ) විභාගය - 2012

ඇගයීම් වාර්තාව

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2012

ඇගයීම් වාර්තාව

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2012

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල්
පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය
(TSEP-WB) මගිනි.

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, මෙම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2013 නොවැම්බර් 11
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපදේශකත්වය	:	ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය හා සංස්කරණය	:	ඩබ්.ඒ.එස්.බී. පෙරේරා සහකාර විභාග කොමසාරිස්
සැකසුම් කමිටුව	:	පී.ඒ. නිලූකා සුරංජි අනුරාධා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මූල්‍ය අධ්‍යනාංශය කළමනාකරණ හා වාණිජ්‍ය පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය නුගේගොඩ එම්.ඒ.අයි.පී. පෙරේරා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජාතික අධ්‍යාපන ආයතනය මහරගම ආර්.පී.ඩී.ජී. රාජපක්ෂ ශ්‍රී ලංකා ගුරු සේවය බප/ජය/හෙන්රි ඕල්කට් විද්‍යාලය කොළොන්නාව පී.ඒ. ආනන්ද ශ්‍රී ලංකා ගුරු සේවය බප/හෝ/ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය පනාගොඩ හෝමාගම
පරිගණක පිටපත සැකසුම	:	කේ.ඒ.අයි. බණ්ඩාර දත්ත සටහන් ක්‍රියාකරු

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. විෂය අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අරමුණු 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 11
2.1.2. I ප්‍රශ්න පත්‍රය 12
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 16
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව 17
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 18
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 19

2.2 II ප්‍රශ්න පත්‍රය

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 20
2.2.2. II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 42

III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් සැලකිලිමත් විය යුතු කරුණු 43

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 44

I කොටස

1. විෂය අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1. විෂය අරමුණු

- ⋆ ව්‍යාපාර පරිසරයේ පවතින අවස්ථා හා අභියෝග පිළිබඳ අනුදැනුම සහිත ව ව්‍යාපාර අවස්ථා තේරීම
- ⋆ මනා ව්‍යාපාර කළමනාකරණය සඳහා හැකියාව ලබා ගැනීම
- ⋆ ව්‍යාපාර ආයතනයක ගනුදෙනු නිවැරදි ව වාර්තා කිරීමට, විශ්ලේෂණය කිරීමට යොමු වීමෙන් ව්‍යාපාරයේ තත්ත්වය පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කිරීම
- ⋆ ව්‍යාපාර ආශ්‍රිත වෘත්තියකට නැඹුරුවීම හෝ තමාගේ ම ව්‍යවසායක් ආරම්භ කිරීමේ හැකියාව ඇති කිරීම
- ⋆ ශ්‍රී ලංකාවේ ආර්ථික හා සාමාජයීය සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම

1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	71,964	1,564	73,528
දෙමළ	19,305	2,354	21,659
ඉංග්‍රීසි	1,977	2,389	4,366
එකතුව	**93,246**	**6,307**	**99,553**

වගුව 1

1.2.2. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	22,295	23.91	1,300	20.61	23,595	23.70
B	14,448	15.49	815	12.92	15,263	15.33
C	22,136	23.74	1,281	20.31	23,417	23.52
S	21,331	22.88	1,531	24.27	22,862	22.96
W	13,036	13.98	1,380	21.89	14,416	14.49
එකතුව	**93,246**	**100**	**6,307**	**100**	**99,553**	**100**

වගුව 2

1.2.3. පළමු වතාවට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	20337	6631	32.61	3347	16.46	4469	21.97	3614	17.77	18061	88.81	2276	11.19
2. ගම්පහ	12719	3136	24.66	2047	16.09	3025	23.78	2713	21.33	10921	85.86	1798	14.14
3. කළුතර	5831	1446	24.80	925	15.86	1395	23.92	1258	21.57	5024	86.16	807	13.84
4. මහනුවර	5167	1097	21.23	818	15.83	1269	24.56	1221	23.63	4405	85.25	762	14.75
5. මාතලේ	902	98	10.86	136	15.08	236	26.16	306	33.92	776	86.03	126	13.97
6. නුවරඑළිය	1977	219	11.08	215	10.88	467	23.62	669	33.84	1570	79.41	407	20.59
7. ගාල්ල	5950	1622	27.26	1036	17.41	1489	25.03	1151	19.34	5298	89.04	652	10.96
8. මාතර	3253	1102	33.88	531	16.32	754	23.18	608	18.69	2995	92.07	258	7.93
9. හම්බන්තොට	1681	413	24.57	295	17.55	451	26.83	389	23.14	1548	92.09	133	7.91
10. යාපනය	2909	720	24.75	498	17.12	741	25.47	634	21.79	2593	89.14	316	10.86
11. කිලිනොච්චි	357	38	10.64	50	14.01	80	22.41	112	31.37	280	78.43	77	21.57
12. මන්නාරම	311	50	16.08	34	10.93	73	23.47	95	30.55	252	81.03	59	18.97
13. වව්නියාව	703	159	22.62	123	17.50	175	24.89	169	24.04	626	89.05	77	10.95
14. මුලතිව්	220	22	10.00	31	14.09	68	30.91	60	27.27	181	82.27	39	17.73
15. මඩකලපුව	1426	366	25.67	246	17.25	387	27.14	331	23.21	1330	93.27	96	6.73
16. අම්පාර	1575	276	17.52	247	15.68	385	24.44	455	28.89	1363	86.54	212	13.46
17. ත්‍රිකුණාමලය	1168	223	19.09	187	16.01	341	29.20	251	21.49	1002	85.79	166	14.21
18. කුරුණෑගල	2566	529	20.62	469	18.28	693	27.01	619	24.12	2310	90.02	256	9.98
19. පුත්තලම	3071	664	21.62	498	16.22	739	24.06	794	25.85	2695	87.76	376	12.24
20. අනුරාධපුරය	2376	480	20.20	357	15.03	629	26.47	597	25.13	2063	86.83	313	13.17
21. පොළොන්නරුව	1158	202	17.44	186	16.06	335	28.93	287	24.78	1010	87.22	148	12.78
22. බදුල්ල	2538	367	14.46	305	12.02	592	23.33	767	30.22	2031	80.02	507	19.98
23. මොනරාගල	633	94	14.85	93	14.69	167	26.38	171	27.01	525	82.94	108	17.06
24. රත්නපුරය	3397	874	25.73	530	15.60	839	24.70	742	21.84	2985	87.87	412	12.13
25. කෑගල්ල	2432	480	19.74	367	15.09	670	27.55	630	25.90	2147	88.28	285	11.72
සමස්ත දිවයින	**85946**	**21693**	**25.24**	**13830**	**16.09**	**20800**	**24.20**	**18887**	**21.98**	**75210**	**87.50**	**10736**	**12.49**

වගුව 3

1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

අධ්‍යාපන කලාපය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	11216	4053	36.14	1780	15.87	2294	20.45	1783	15.90	9910	88.36	1306	11.64
2. හෝමාගම	1502	272	18.11	200	13.32	377	25.10	389	25.90	1238	82.42	264	17.58
3. ශ්‍රී ජයවර්ධනපුර	3939	1292	32.80	722	18.33	912	23.15	712	18.08	3638	92.36	301	7.64
4. පිළියන්දල	3680	1014	27.55	645	17.53	886	24.08	730	19.84	3275	88.99	405	11.01
5. ගම්පහ	3726	1214	32.58	631	16.94	799	21.44	676	18.14	3320	89.10	406	10.90
6 මිනුවන්ගොඩ	1647	321	19.49	290	17.61	444	26.96	368	22.34	1423	86.40	224	13.60
7. මීගමුව	3794	845	22.27	575	15.16	927	24.43	834	21.98	3181	83.84	613	16.16
8. කැලණිය	3552	756	21.28	551	15.51	855	24.07	835	23.51	2997	84.38	555	15.63
9. කළුතර	3868	994	25.70	607	15.69	903	23.35	842	21.77	3346	86.50	522	13.50
10. මතුගම	674	164	24.33	112	16.62	174	25.82	140	20.77	590	87.54	84	12.46
11. හොරණ	1289	288	22.34	206	15.98	318	24.67	276	21.41	1088	84.41	201	15.59
12. මහනුවර	2362	739	31.29	470	19.90	597	25.28	407	17.23	2213	93.69	149	6.31
13. දෙනුවර	489	60	12.27	71	14.52	105	21.47	171	34.97	407	83.23	82	16.77
14. ගම්පොල	981	128	13.05	117	11.93	238	24.26	265	27.01	748	76.25	233	23.75
15. තෙල්දෙණිය	156	13	8.33	19	12.18	33	21.15	48	30.77	113	72.44	43	27.56
16. වත්තේගම	445	61	13.71	66	14.83	122	27.42	109	24.49	358	80.45	87	19.55
17. කටුගස්තොට	734	96	13.08	75	10.22	174	23.71	221	30.11	566	77.11	168	22.89
18. මාතලේ	642	77	11.99	94	14.64	170	26.48	209	32.55	550	85.67	92	14.33
19. ගලේවෙල	194	13	6.70	29	14.95	57	29.38	69	35.57	168	86.60	26	13.40
20. නාඋල	19	3	15.79	2	10.53	2	10.53	11	57.89	18	94.74	1	5.26
21. විල්ගමුව	47	5	10.64	11	23.40	7	14.89	17	36.17	40	85.11	7	14.89
22. නුවරඑළිය	552	45	8.15	42	7.61	98	17.75	215	38.95	400	72.46	152	27.54
23. කොත්මලේ	266	33	12.41	33	12.41	73	27.44	77	28.95	216	81.20	50	18.80
24. හැටන්	696	102	14.66	89	12.79	140	20.11	220	31.61	551	79.17	145	20.83
25. වලපනේ	166	13	7.83	9	5.42	56	33.73	63	37.95	141	84.94	25	15.06
26. හඟුරන්කෙත	297	26	8.75	42	14.14	100	33.67	94	31.65	262	88.22	35	11.78
27. ගාල්ල	3098	925	29.86	534	17.24	733	23.66	584	18.85	2776	89.61	322	10.39
28. ඇල්පිටිය	877	178	20.30	151	17.22	258	29.42	185	21.09	772	88.03	105	11.97
29. අම්බලන්ගොඩ	1590	425	26.73	281	17.67	385	24.21	299	18.81	1390	87.42	200	12.58
30. උඩුගම	385	94	24.42	70	18.18	113	29.35	83	21.56	360	93.51	25	6.49
31. මාතර	1955	812	41.53	310	15.86	430	21.99	297	15.19	1849	94.58	106	5.42
32. අකුරැස්ස	398	108	27.14	47	11.81	96	24.12	88	22.11	339	85.18	59	14.82
33. මුලටියන-හක්මණ	411	80	19.46	78	18.98	102	24.82	110	26.76	370	90.02	41	9.98
34. මොරවක-දෙනියාය	489	102	20.86	96	19.63	126	25.77	113	23.11	437	89.37	52	10.63

අධ්‍යාපන කලාපය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
35. තංගල්ල	540	139	25.74	107	19.81	146	27.04	121	22.41	513	95.00	27	5.00
36. හම්බන්තොට	700	122	17.43	101	14.43	188	26.86	209	29.86	620	88.57	80	11.43
37. වලස්මුල්ල	441	152	34.47	87	19.73	117	26.53	59	13.38	415	94.10	26	5.90
38. යාපනය	1414	409	28.93	262	18.53	375	26.52	255	18.03	1301	92.01	113	7.99
39. දූපත්	82	7	8.54	5	6.10	20	24.39	30	36.59	62	75.61	20	24.39
40. තෙන්මාරච්චි	201	72	35.82	44	21.89	41	20.40	35	17.41	192	95.52	9	4.48
41. වලිකාමම්	619	108	17.45	85	13.73	169	27.30	173	27.95	535	86.43	84	13.57
42. වඩමරච්චි	593	124	20.91	102	17.20	136	22.93	141	23.78	503	84.82	90	15.18
43. කිලිනොච්චි	357	38	10.64	50	14.01	80	22.41	112	31.37	280	78.43	77	21.57
44. මන්නාරම	293	49	16.72	33	11.26	64	21.84	90	30.72	236	80.55	57	19.45
45. මඩු	18	1	5.56	1	5.56	9	50.00	5	27.78	16	88.89	2	11.11
46. වව්නියාව	648	151	23.30	113	17.44	165	25.46	151	23.30	580	89.51	68	10.49
47. වව්නියාව උතුර	55	8	14.55	10	18.18	10	18.18	18	32.73	46	83.64	9	16.36
48. මුලතිව්	168	20	11.90	26	15.48	58	34.52	39	23.21	143	85.12	25	14.88
49. තුනුක්කායි	52	2	3.85	5	9.62	10	19.23	21	40.38	38	73.08	14	26.92
50. මඩකලපුව	575	172	29.91	104	18.09	165	28.70	116	20.17	557	96.87	18	3.13
51. කල්කුඩා	145	30	20.69	29	20.00	44	30.34	29	20.00	132	91.03	13	8.97
52. පදිරිප්පු	126	38	30.16	18	14.29	38	30.16	20	15.87	114	90.48	12	9.52
53. මඩකලපුව (මධ්‍යම)	580	126	21.72	95	16.38	140	24.14	166	28.62	527	90.86	53	9.14
54. මඩකලපුව (බටහිර)	73	7	9.59	7	9.59	29	39.73	22	30.14	65	89.04	8	10.96
55. අම්පාර	134	11	8.21	25	18.66	51	38.06	32	23.88	119	88.81	15	11.19
56. කල්මුනේ	422	80	18.96	56	13.27	84	19.91	139	32.94	359	85.07	63	14.93
57. සමන්තුරෙයි	182	32	17.58	26	14.29	40	21.98	51	28.02	149	81.87	33	18.13
58. මහඔය	106	18	16.98	18	16.98	24	22.64	31	29.25	91	85.85	15	14.15
59. දෙහිඅත්තකණ්ඩිය	218	65	29.82	53	24.31	67	30.73	29	13.30	214	98.17	4	1.83
60. අක්කරෙයිපත්තුව	513	70	13.65	69	13.45	119	23.20	173	33.72	431	84.02	82	15.98
61. තිරුක්කෝවිල්	45	11	24.44	11	24.44	13	28.89	8	17.78	43	95.56	2	4.44
62. ත්‍රිකුණාමලය	923	181	19.61	138	14.95	264	28.60	202	21.89	785	85.05	138	14.95
63. මුතූර්	64	19	29.69	17	26.56	20	31.25	6	9.38	62	96.88	2	3.13
64. කන්තලේ	130	17	13.08	25	19.23	47	36.15	28	21.54	117	90.00	13	10.00
65. කින්නියා	51	6	11.76	7	13.73	10	19.61	15	29.41	38	74.51	13	25.49
66. ත්‍රිකුණාමලය (උතුර)	37	2	5.41	2	5.41	8	21.62	14	37.84	26	70.27	11	29.73
67. කුරුණෑගල	1171	367	31.34	241	20.58	289	24.68	214	18.27	1111	94.88	60	5.12
68. කුලියාපිටිය	709	195	27.50	159	22.43	174	24.54	132	18.62	660	93.09	49	6.91
69. නිකවැරටිය	275	40	14.55	47	17.09	75	27.27	84	30.55	246	89.45	29	10.55
70. මහව	284	55	19.37	43	15.14	92	32.39	66	23.24	256	90.14	28	9.86
71. ගිරිඋල්ල	838	134	15.99	140	16.71	240	28.64	223	26.61	737	87.95	101	12.05
72. ඉබ්බාගමුව	423	103	24.35	78	18.44	104	24.59	100	23.64	385	91.02	38	8.98
73. පුත්තලම	981	159	16.21	141	14.37	240	24.46	308	31.40	848	86.44	133	13.56
74. හලාවත	2090	505	24.16	357	17.08	499	23.88	486	23.25	1847	88.37	243	11.63

අධ්‍යාපන කලාපය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
75. අනුරාධපුරය	1271	317	24.94	199	15.66	303	23.84	294	23.13	1113	87.57	158	12.43
76. තඹුත්තේගම	352	53	15.06	44	12.50	92	26.14	104	29.55	293	83.24	59	16.76
77. කැකිරාව	311	43	13.83	57	18.33	83	26.69	84	27.01	267	85.85	44	14.15
78. ගලෙන්බිඳුනුවැව	213	20	9.39	20	9.39	88	41.31	55	25.82	183	85.92	30	14.08
79. කැබිතිගොල්ලෑව	229	47	20.52	37	16.16	63	27.51	60	26.20	207	90.39	22	9.61
80. පොළොන්නරුව	446	120	26.91	76	17.04	103	23.09	97	21.75	396	88.79	50	11.21
81. හිඟුරක්ගොඩ	452	56	12.39	72	15.93	144	31.86	120	26.55	392	86.73	60	13.27
82. දිඹුලාගල	260	26	10.00	38	14.62	88	33.85	70	26.92	222	85.38	38	14.62
83. බදුල්ල	817	98	12.00	92	11.26	185	22.64	246	30.11	621	76.01	196	23.99
84. බණ්ඩාරවෙල	929	188	20.24	127	13.67	202	21.74	250	26.91	767	82.56	162	17.44
85. මහියංගනය	157	35	22.29	25	15.92	46	29.30	35	22.29	141	89.81	16	10.19
86. වැලිමඩ	475	39	8.21	54	11.37	109	22.95	165	34.74	367	77.26	108	22.74
87. පස්සර	160	7	4.38	7	4.38	50	31.25	71	44.38	135	84.38	25	15.63
88. මොණරාගල	230	36	15.65	34	14.78	61	26.52	52	22.61	183	79.57	47	20.43
89. වැල්ලවාය	238	41	17.23	38	15.97	66	27.73	64	26.89	209	87.82	29	12.18
90. බිබිල	165	17	10.30	21	12.73	40	24.24	55	33.33	133	80.61	32	19.39
91. රත්නපුර	1760	603	34.26	303	17.22	405	23.01	301	17.10	1612	91.59	148	8.41
92. බළන්ගොඩ	583	129	22.13	97	16.64	145	24.87	131	22.47	502	86.11	81	13.89
93. නිවිතිගල	380	60	15.79	56	14.74	117	30.79	104	27.37	337	88.68	43	11.32
94. ඇඹිලිපිටිය	674	82	12.17	74	10.98	172	25.52	206	30.56	534	79.23	140	20.77
95. කෑගල්ල	1152	305	26.48	197	17.10	293	25.43	244	21.18	1039	90.91	113	9.81
96. මාවනැල්ල	674	103	15.28	94	13.95	211	31.31	200	29.67	608	90.21	66	9.79
97. දෙහිඕවිට	606	72	11.88	76	12.54	166	27.39	186	30.69	500	82.51	106	17.49
සමස්ත දිවයින	**85946**	**21693**	**25.24**	**13830**	**16.09**	**20800**	**24.20**	**18887**	**21.98**	**75210**	**87.50**	**10736**	**12.49**

වගුව 4

1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	1805	1.81	99553	100
81 - 90	9340	9.38	97748	98.19
71 - 80	14946	15.01	88408	88.81
61 - 70	15936	16.01	73462	73.80
51 - 60	16648	16.72	57526	57.79
41 - 50	15208	15.28	40878	41.07
31 - 40	13613	13.68	25670	25.79
21 - 30	8554	8.59	12057	12.11
11 - 20	3268	3.28	3503	3.52
01 - 10	235	0.24	235	0.24
00 - 00	0	0.00	0	0.00

වගුව 5

ඉහත වගුවේ තොරතුරු අර්ථකථනය කරන ආකාරය පහත සඳහන් උදාහරණයෙන් දැක් වේ.
උදා:- (31 - 40 පන්ති ප්‍රාන්තරය සැලකිල්ලට ගත්විට)
මෙම විෂයය සඳහා ලකුණු 31 - 40 අතර ලකුණු ලබාගත් පරීක්ෂිතයින් සංඛ්‍යාව 13613කි.
එය ප්‍රතිශතයක් වශයෙන් 13.68%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති පරීක්ෂිතයින් සංඛ්‍යාව 25670ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 25.79%කි.

1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 : (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයේ තොරතුරු අර්ථකතනය කරන ආකාරය පහත සඳහන් උදාහරණයෙන් දැක් වේ.

උදා:- වැඩි ම අපේක්ෂකයින් සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ ප්‍රශ්න අංක 1ටය. එය ප්‍රතිශතයක් ලෙස 96%කි. එමෙන් ම අපේක්ෂකයින් අඩු ම සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ ප්‍රශ්න අංක 17ටය. එය ප්‍රතිශතයක් ලෙස 11%කි.

1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයේ තොරතුරු විස්තර කරන ආකාරය පහත සඳහන් උදාහරණයෙන් දැක්වේ.

උදා :- ප්‍රශ්න තෝරා ගැනීමේ දී 92%ක් 3 වන ප්‍රශ්නය තෝරා ගෙන තිබූ අතර, 4 වන ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 47%ක් පමණි.

ප්‍රස්තාරය 2 : (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.)

1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයේ තොරතුරු විස්තර කරන ආකාරය පහත සඳහන් උදාහරණයෙන් දැක් වේ.

උදා :

මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. මෙම ලකුණු 20න් 76%-100% යන ලකුණු ප්‍රාන්තරයට ලකුණු 16-20 තෙක් ලබාගත් අය ද, 51%-75% යන ලකුණු ප්‍රාන්තරයට, ලකුණු 11-15 තෙක් ලබාගත් අය ද, 26%-50% යන ලකුණු ප්‍රාන්තරයට ලකුණු 6-10 තෙක් ලබාගත් අය ද සහ 00%-25% යන ලකුණු ප්‍රාන්තරයට ලකුණු 00-05 තෙක් ලබාගත් අය ද ඇතුළත් වේ. ඒ අනුව ලකුණු 16-20 අතර ලබාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 19.5%කි. එමෙන්ම ලකුණු 00-05 තෙක් ලබා ගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 15%කි.

ප්‍රස්තාරය 3 : (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.)

මෙහි 2 සිට 7 තෙක් ප්‍රශ්නවලට වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 10කි. ඒ අනුව, අදාළ ලකුණු ප්‍රාන්තරවලට ඇතුළත් වන ලකුණු සීමා වෙනස් වේ.

1.3.4. **II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය**



ප්‍රස්තාරය 4 : (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයේ තොරතුරු විස්තර කරන ආකාරය පහත සඳහන් උදාහරණයෙන් දැක් වේ.

උදා:- 1 වන ප්‍රශ්නයෙහි (i) කොටසෙහි පහසුතාව 91% ක් වන අතර, මෙම ප්‍රශ්නයේ (ix) කොටසෙහි පහසුතාව 12% කි.

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1. I ප්‍රශ්න පත්‍රය

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 01යි. (ප්‍රශ්න පත්‍රයට නියමිත පැය තුනක (03) කාලයෙන් පැය එකක් (01) I ප්‍රශ්න පත්‍රය සඳහා යොදා ගැනීම අපේක්ෂා කෙරිණි.)

- ⋆ I ප්‍රශ්න පත්‍රය වරණ හතරකින් යුත් බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ.
- ⋆ 1 - 20 තෙක් ප්‍රශ්න ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයෙන් ද, 21 - 40 තෙක් ප්‍රශ්න ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයෙන් ද සකස් කර ඇත.
- ⋆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- ⋆ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) හා (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තේරීම අපේක්ෂා කෙරිණි.
- ⋆ I ප්‍රශ්න පත්‍රය සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු **40**ක් හිමි වේ.

2.1.2. I ප්‍රශ්න පත්‍රය

- පහත සඳහන් ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ඔබගේ එදිනෙදා ජීවිතයේ **අවශ්‍යතා හා වුවමනා** සඳහා වූ බොහෝ ද **ව්‍යාපාර** විසින් සපයනු ලබන **භාණ්ඩ හා සේවා** මඟින් සපුරා ගැනේ. සෑම ව්‍යාපාරයක් ම එහි **ස්වභාවය සහ අයිතිය (හිමිකාරත්වය)** අනුව වර්ග කළ හැකි ය."

1. පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් 'ව්‍යාපාර' යන්න නිර්වචනය කිරීමට වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
   (1) භාණ්ඩ හා සේවා හුවමාරුවීම සම්බන්ධ ඕනෑම කටයුත්තකි.
   (2) භාණ්ඩ හා සේවා මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ ඕනෑම කටයුත්තකි.
   (3) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා සම්බන්ධ ඕනෑම කටයුත්තකි.
   (4) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධ ඕනෑම කටයුත්තකි.

2. ව්‍යාපාර ආරම්භ වූයේ,
   (1) භාණ්ඩ හුවමාරුවේ ප්‍රතිඵලයක් ලෙස ය. (2) මුදල් භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස ය.
   (3) ප්‍රවාහන ක්‍රමවල ප්‍රතිඵලයක් ලෙස ය. (4) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ය.

3. පහත සඳහන් ද අතුරෙන් වුවමනාවක් ලෙස සැලකිය හැක්කේ,
   (1) ආහාර ය. (2) බත් ය. (3) ඇඳුම් ය. (4) නිවාස ය.

4. අයිතිය අනුව ව්‍යාපාර ප්‍රධාන වශයෙන් වර්ග කර දක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ප්‍රාථමික හා ද්විතීයික (2) සුළු හා මහා පරිමාණ
   (3) තනි පුද්ගල හා හවුල් (4) පෞද්ගලික හා පොදු (රාජ්‍ය)

5. නිවැරදි නිෂ්පාදන ක්‍රියාවලිය දක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ක්‍රියාවලිය ⟶ යෙදවුම් ⟶ නිමැවුම් (2) නිමැවුම් ⟶ ක්‍රියාවලිය ⟶ යෙදවුම්
   (3) යෙදවුම් ⟶ ක්‍රියාවලිය ⟶ නිමැවුම් (4) යෙදවුම් ⟶ නිමැවුම් ⟶ ක්‍රියාවලිය

6. ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයේ දැකිය හැකි ශක්තියක් හා බාහිර පරිසරයේ දැකිය හැකි අවස්ථාවක් පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.
   (1) හොඳ මූල්‍ය ස්ථාවරත්වයක් තිබීම හා දක්ෂ කළමනාකරුවන් සිටීම
   (2) දේශීය නිෂ්පාදිත අගය කිරීම හා වයස්ගත ජනගහනය ඉහළ යාම
   (3) ව්‍යාපාරවලට හිතකර නීතිරීති පැනවීම හා ව්‍යාපාරය සඳහා හොඳ සැලැස්මක් තිබීම
   (4) දක්ෂ සේවකයන් සිටීම හා කාන්තාවන් රැකියාවල නිරත වීම

7. "පරිගණක හා අන්තර්ජාලය වර්තමානයේ ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට ඉවහල් වී ඇත."
   ඉහත ප්‍රකාශයෙන් හැඟවෙන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?
   (1) ආර්ථික (2) තාක්ෂණික (3) ප්‍රජා (4) දේශපාලන

8. මෙහෙයුම් සැලැස්මේ පමණක් ඇතුළත් කරනු ලබන අයිතමය තෝරන්න.
   (1) ඇස්තමේන්තුගත විකුණුම් (2) ඇස්තමේන්තුගත අමුද්‍රව්‍ය පිරිවැය
   (3) ඇස්තමේන්තුගත ස්ථාවර වත්කම් (4) ඇස්තමේන්තුගත ලාභය

9. මුළු නිෂ්පාදන පිරිවැය නිවැරදිව දක්වෙන ප්‍රකාශය තෝරන්න.
   (1) සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් වියදම් + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය
   (2) සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් වියදම් + ප්‍රාථමික පිරිවැය
   (3) වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රම පිරිවැය + වක්‍ර වෙනත් වියදම් + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය
   (4) සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය

10. ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී ඇස්තමේන්තුගත ලාභය ඇතුළත් කරනුයේ,
    (1) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ය. (2) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශයේ ය.
    (3) ඇස්තමේන්තුගත ශේෂ පත්‍රයේ ය. (4) වෙළෙඳ හා ලාභාලාභ ගිණුමේ ය.

11. ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම තුළින් ව්‍යාපාරිකයෙකුට ලැබෙන **වැදගත් ම** ප්‍රයෝජනය වන්නේ,
    (1) අරමුදල් ලබා ගැනීමට පහසු වීම ය.
    (2) අවශ්‍ය සම්පත් හඳුනාගැනීමට හැකි වීම ය.
    (3) සේවකයින්ට ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම ය.
    (4) ව්‍යාපාරයේ අරමුණු කරා ළඟාවීමට නිවැරදි මග පෙන්වීම ය.

12. සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීම කළ යුත්තේ,
    (1) සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ය. (2) සමුපකාර සංවර්ධන කොමසාරිස් කාර්යාලයේ ය.
    (3) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ය. (4) ජාතික සමුපකාර මණ්ඩලයේ ය.

13. පහත X තීරුවේ වාණිජ බැංකුවලින් ලබාගත හැකි සේවා ද Y තීරුවේ ඒ එක් එක් සේවාව සඳහා නිදසුන් ද දක්වේ.

X	Y
1. තැන්පතු බාර ගැනීම	A - බැංකු අයිරා
2. ණය සැපයීම	B - ණය පත්
3. විද්‍යුත් මුදල් පහසුකම්	C - ඇමරිකානු ඩොලර් මිලදී ගැනීම
4. විදේශ විනිමය හුවමාරුව	D - ජංගම ගිණුම්

X තීරුවේ ඇති සේවා Y තීරුවේ ඇති නිදසුන් සමග නිවැරදිව අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) B, D, A, C ය. (2) D, C, A, B ය. (3) D, A, B,C ය. (4) D, A, C, B ය.

14. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) රේඛනය කරන ලද චෙක්පතකට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගත හැකි ය.

(2) චෙක්පතක් රේඛනය කළ හැක්කේ අණකරුට පමණි.

(3) චෙක්පත් මගින් ගෙවීම් කිරීමට බැංකු ජංගම ගිණුමක් අවශ්‍ය නොවේ.

(4) චෙක්පතක අණලද්දා සැමවිට ම වාණිජ බැංකුවකි.

15. පහත දක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියේ උපාංග ඇතුළත් රූපසටහනකි.



ඉහත රූපසටහනේ අංක 2 හා 4 ස්ථානවලට ගැළපෙන උපාංග පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) පණිවුඩය සහ ශබ්දය (2) ශබ්දය සහ ලබන්නා

(3) පණිවුඩය සහ ලබන්නා (4) ලබන්නා සහ පණිවුඩය

16. පහත දක්වෙන්නේ සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි ක්‍රම කිහිපයකි.

A - මාණ්ඩලික රැස්වීම B - දන්වීම් පුවරුව

C - ඉන්ටර්කොම් D - විද්‍යුත් තැපෑල

ඉහත ද අතුරෙන් අභ්‍යන්තර වාචික ක්‍රම ලෙස සැලකෙන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) C හා D ය.

17. රක්ෂණය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) ස්වර්ණාභරණ උකස්කරුවෙකුට උකසට ගත් භාණ්ඩ පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.

(2) පියෙකුට තම පුතුගේ ජීවිතය පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.

(3) ස්වාමිපුරුෂයෙකුට තම භාර්යාවගේ ජීවිතය පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.

(4) කල්බදු ක්‍රමයට ගත් මෝටර් රථය පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් මෝටර් රථ හිමියාට ඇත.

18. සීමාසහිත සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් ආයෝජකයෙකුට ලැබිය හැකි ප්‍රතිලාභයක් වන්නේ,

(1) ප්‍රාග්ධන ලාභ ලැබීම ය. (2) පොළී ලැබීම ය.

(3) ස්ථිර ලාභාංශයක් ලැබීම ය. (4) සමුච්චිත ලාභාංශ ලැබිය හැකි වීම ය.

19. ආයෝජනයක ප්‍රතිලාභ හා අවදානම අතර ඇති සම්බන්ධය නිවැරදි ව දක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප්‍රතිලාභ ඉහළ විට, අවදානම පහළ ය. (2) ප්‍රතිලාභ ඉහළ විට, අවදානම ඉහළ ය.

(3) ප්‍රතිලාභ පහළ විට, අවදානම ඉහළ ය. (4) ප්‍රතිලාභ නැත, අවදානම ඉහළ ය.

20. පහත සඳහන් ව්‍යාපාර අතුරෙන් කොටස් වෙළෙඳපොළ තුළ කොටස් අලෙවි කළ හැකි වනුයේ,

(1) සී/ස කඩුපුල් (පෞද්) සමාගමට ය. (2) සී/ස ලක් නිෂ්පාදන සමාගමට ය.

(3) ගුණසිංහ සහ පුත්‍රයෝ (4) සී/ස ජයමිණි (පී.එල්.සී.) සමාගමට ය.

21. ගිණුම්කරණ සමීකරණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අයිතිකරුගේ ප්‍රාග්ධනයෙන්, වගකීම් අඩුකළ පසු ලැබෙන වටිනාකම ව්‍යාපාරයේ වත්කම්වලට සමාන වේ

(2) අයිතිකරුගේ ප්‍රාග්ධනය පවතින විට, වත්කම්වල වටිනාකම වගකීම්වලට සමාන වේ.

(3) බැංකු ණයක් ලබාගෙන ඇති විට, වත්කම්වල වටිනාකම අයිතිකරුගේ ප්‍රාග්ධනයට සමාන වේ.

(4) වත්කම්වල වටිනාකමෙන් වගකීම්වල වටිනාකම අඩු කළ පසු අගය අයිතිකරුගේ ප්‍රාග්ධනය වේ.

22. ව්‍යාපාරයක වත්කම් සහ වගකීම් යන දෙකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වනුයේ,

(1) රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීම ය. (2) රු. 10 000 ක භාණ්ඩ ණයට විකිණීම ය.

(3) ණයහිමියකුට රු. 10 000 ක් ගෙවීම ය. (4) ණයගැතියකුගෙන් රු. 1 000 ක් ලැබීම ය.

23. ආපසු යැවුම් සටහන් කිරීමට උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛනය කුමක් ද?

(1) ඉන්වොයිසිය (2) හරපත (3) බැරපත (4) ඉන්ඩෙන්ටුව

24. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) සුළු මුදල් අග්‍රිම ක්‍රමයට අනුව සෑම මාසයක් අවසානයේ දීම සමාන මුදලක් ප්‍රතිපූරණය කෙරේ.
   (2) දුන් වට්ටම් ආදායමක් වන අතර ලද වට්ටම් වියදමක් වේ.
   (3) ගැනිලි ගිණුම වියදම් ගිණුමකි.
   (4) මුදල් පොත උපයෝගී පොතක් ලෙස මෙන් ම ලෙජර් ගිණුමක් ලෙස ද කටයුතු කරයි.

25. පහත ගනුදෙනු අතුරෙන් ගැනුම් ජ්නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,
   (1) රු. 5 000 ක බඩු තොග ණයට ගැනීම ය.
   (2) රු. 5 000 ක බඩු තොග අත්පිට මුදලට ගැනීම ය.
   (3) රු. 5 000 ක කාර්යාල උපකරණ ණයට ගැනීම ය.
   (4) රු. 5 000 ක කාර්යාල උපකරණ අත්පිට මුදලට ගැනීම ය.

26. සඳුන්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 2 000 කි. දෙසැම්බර් මාසය තුළ ඉන් රු. 1 950 ක් වියදම් කර තිබුණි. සුළු මුදල් අග්‍රිමය ප්‍රමාණවත් නොවන නිසා එය රු. 3 000 දක්වා වැඩිකොට දෙසැම්බර් 31 දින ප්‍රතිපූරණය කරන ලදී. ප්‍රතිපූරණය කරන ලද මුදල කොපමණ ද?
   (1) රු. 1 950   (2) රු. 2 000   (3) රු. 2 950   (4) රු. 3 000

27. බැංකුව විසින් අයකරනු ලබන බැංකු ගාස්තු ව්‍යාපාරය සටහන් කරනුයේ එහි මුදල් පොතේ,
   (1) බැංකු තීරුවේ බැරට ය.   (2) බැංකු තීරුවේ හරට ය.
   (3) මුදල් තීරුවේ බැරට ය.   (4) මුදල් තීරුවේ හරට ය.

28. පහත දක්වෙන්නේ වැරදි නිවැරදි කිරීමක් සම්බන්ධ ව පොදු ජ්නලයේ තිබූ ද්විත්ව සටහනකි.

අවිනිශ්චිත ගිණුම හර	රු. 2 500	
විකුණුම් ගිණුම		රු. 2 500

මෙම ද්විත්ව සටහනට අදළ නිවැරදි සංලක්ෂ්‍යය වනුයේ,
   (1) රු. 2 500 ක ණයට විකුණුම් සම්පූර්ණයෙන් ගිණුම්ගත නොවීම නිසා ඇති වූ වරද නිවැරදි කිරීම ය.
   (2) රු. 2 500 ක අත්පිට විකුණුම්, මුදල් පොතේ පමණක් සටහන් වීම නිසා ඇති වූ වරද නිවැරදි කිරීම ය.
   (3) රු. 2 500 ක ණයට විකුණුම්, විකුණුම් ගිණුමේ පමණක් සටහන් වීම නිසා ඇති වූ වරද නිවැරදි කිරීම ය.
   (4) රු. 2 500 ක අත්පිට විකුණුම්, විකුණුම් ගිණුමේ දෙවරක් සටහන් වීම නිසා ඇති වූ වරද නිවැරදි කිරීම ය.

29. ලද පොළී ගිණුමේ ශේෂය වූ රු. 8 500, ශේෂ පිරික්සුමේ බැර පැත්තට රු. 8 000 ක් ලෙස සටහන් වීම නිසා ඇති වූ වරද නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුම,
   (1) රු. 1 000 කින් හර කළ යුතු ය.   (2) රු. 500 කින් බැර කළ යුතු ය.
   (3) රු. 500 කින් හර කළ යුතු ය.   (4) රු. 1 000 කින් බැර කළ යුතු ය.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **30** හා **31** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
රන්තරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200 ක් වූ අතර එහි මාසික සාමාජික ගාස්තුව රු. 10 කි. සාමාජිකයින් 20 දෙනකු 2011 වර්ෂය සඳහා කිසිදු සාමාජික ගාස්තුවක් ගෙවා නැත.

30. මෙහි ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් කෙරෙන සාමාජික ගාස්තුව හා ශේෂ පත්‍රයේ දක්වෙන සාමාජික ගාස්තුව පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.
   (1) රු. 1 800 හා රු. 200   (2) රු 2 000 හා රු. 200
   (3) රු. 21 600 හා රු. 2 400   (4) රු. 24 000 හා රු. 2 400

31. ලාභ අරමුණු කරගත් ව්‍යාපාරවල මුදල් පොතට සමානව ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරවල පිළියෙල කරනුයේ,
   (1) ලැබීම් හා ගෙවීම් ගිණුම ය.   (2) ආදායම් හා වියදම් ගිණුම ය.
   (3) ලාභාලාභ ගිණුම ය.   (4) වෙළඳ ගිණුම ය.

32. ණය ගැතියෙකු වූ රවිඳුගෙන් ලැබිය යුතු රු. 1 500 ක් බොල් ණය ලෙස කපා හැරීම නිසා එම ව්‍යාපාරයේ,
   (1) වත්කම් රු. 1 500 කින් අඩු වේ.   (2) වියදම් රු. 1 500 කින් අඩු වේ.
   (3) ආදායම් රු. 1 500 කින් වැඩි වේ.   (4) වගකීම් රු. 1 500 කින් අඩු වේ.

33. කෝසලගේ ව්‍යාපාරයේ 2012.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ ඇතුළත් ලී බඩු ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ශේෂය සටහන් කරනුයේ,
   (1) වෙළඳ ගිණුමේ ය.   (2) ලාභාලාභ ගිණුමේ ය.
   (3) ශේෂ පත්‍රයේ ය.   (4) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ය.

34. සුදර්ශනගේ ව්‍යාපාරයේ වාර්ෂික රක්ෂණ ගාස්තුව රු. 8 000 ක් වන නමුත් 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී රු. 10 000 ක් ගෙවා ඇත. 2012.03.31 දිනට පිළියෙල කරනු ලබන ශේෂ පත්‍රයේ මෙය දක්වෙනුයේ,
   (1) ජංගම වගකීම් යටතේ උපචිත රක්ෂණය රු. 2 000 ක් ලෙස ය.
   (2) ජංගම වත්කම් යටතේ පෙර ගෙවූ රක්ෂණය රු. 2 000 ක් ලෙස ය.
   (3) ජංගම වගකීම් යටතේ උපචිත රක්ෂණය රු. 8 000 ක් ලෙස ය.
   (4) ජංගම වත්කම් යටතේ පෙර ගෙවූ රක්ෂණය රු. 10 000 ක් ලෙස ය.

35. සරල මාර්ග ක්ෂය ක්‍රමයට අනුව ස්ථාවර වත්කමක වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිත වන නිවැරදි සමීකරණය වන්නේ,

(1) (වත්කමේ වෙළෙඳපොළ අගය – සුන්බුන් අගය) / ඵලදායී ජීව කාලය

(2) (වත්කමේ පිරිවැය – සුන්බුන් අගය) / ඵලදායී ජීව කාලය

(3) (වත්කමේ පිරිවැය – වත්කමේ වෙළෙඳපොළ අගය) / ඵලදායී ජීව කාලය

(4) (වත්කමේ පිරිවැය – වත්කමේ ක්ෂය කළ හැකි අගය) / ඵලදායී ජීව කාලය

36. පහත සඳහන් ගනුදෙනු අතුරෙන් ව්‍යාපාරයක ශුද්ධ ලාභය අඩු වීමට බලපානුයේ,
(1) ණය ගැතියන්ගෙන් රු. 10 000 ක මුදලක් ලබා ගැනීම ය.
(2) ණය හිමියන්ට රු. 5 000 ක් මුදලින් ගෙවීම ය.
(3) පසුගිය වර්ෂයේ හිඟහිටි රක්ෂණ ගාස්තු රු. 4 000 මුදලින් ගෙවීම ය.
(4) ණයගැතියන්ගෙන් බොල්ණය රු. 1 200 ක් කපා හැරීම ය.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක **37** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
කුසල්ගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2012.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දක්වේ.

	හර (රු.)	බැර (රු.)
තොගය (2011.04.01 දිනට)	13 500	
ගැනුම්	100 000	
විකුණුම්		180 000
ආපසු එවුම්	3 500	
ආපසු යැවුම්		2 300
මෝටර් රථ (පිරිවැයට)	350 000	
ගොඩනැගිලි (පිරිවැයට)	270 000	
ලද වට්ටම්		2 000
වේතන	17 000	
ලද කොමිස්		2 200
ලද කඩකුලී		1 500
බැංකු ණය පොළී	1 000	
ආයෝජන ආදායම්		2 000
12% බැංකු ණය		10 000
ප්‍රාග්ධනය		600 000
මුදල් ශේෂය	45 000	
	800 000	800 000

අමතර තොරතුරු :
1. 2012.03.31 දිනට තොගය රු. 18 000 කි.
2. මෝටර් රථ පිරිවැයෙන් **10%** ක් ක්ෂය කළ යුතු ය.

37. මෙම ව්‍යාපාරයේ 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වනුයේ,
(1) රු. 80 000 කි. (2) රු. 81 000 කි. (3) රු. 83 300 කි. (4) රු. 86 800 කි.

38. මෙම ව්‍යාපාරයේ 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දක්වෙන බැංකු ණය පොළිය වනුයේ,
(1) රු. 200 කි. (2) රු. 800 කි. (3) රු. 1 000 කි. (4) රු. 1 200 කි.

39. මෙම ව්‍යාපාරයේ 2012.03.31 දිනට මුළු ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය වනුයේ,
(1) රු. 270 000 කි. (2) රු. 315 000 කි. (3) රු. 585 000 කි. (4) රු. 620 000 කි.

40. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි වෙළෙඳ නොවන ආදායම් වනුයේ,
(1) ලද වට්ටම් හා ලද කඩ කුලී වේ. (2) ලද කොමිස් හා ආයෝජන ආදායම් වේ.
(3) ලද වට්ටම් හා ලද කොමිස් වේ. (4) ලද කඩ කුලී හා ආයෝජන ආදායම් වේ.

**

2.1.3. **I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	4	21	4
02	1	22	1
03	2	23	2
04	4	24	4
05	3	25	1
06	4	26	3
07	2	27	1
08	2	28	2
09	1	29	3
10	2	30	4
11	4	31	1
12	2	32	1
13	3	33	3
14	4	34	2
15	3	35	2
16	2	36	4
17	2	37	3
18	1	38	4
19	2	39	3
20	4	40	4

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

2.1.4 **I** ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව



ප්‍රස්තාරය 5



ප්‍රස්තාරය 6

ප්‍රස්තාර අංක 6ට අනුව ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්න සඳහා පහසුතාව 67%ක් ද ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්න සඳහා පහසුතාව 62%ක් ද වේ.

2.1.5 **I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස**

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය			
		1	2	3	4
1	4	1%	1%	1%	97%
2	1	83%	10%	1%	6%
3	2	4%	86%	7%	3%
4	4	3%	2%	22%	73%
5	3	4%	2%	92%	2%
6	4	12%	8%	8%	72%
7	2	2%	95%	2%	1%
8	2	16%	43%	26%	15%
9	1	71%	11%	6%	12%
10	2	8%	38%	18%	36%
11	4	4%	5%	2%	89%
12	2	12%	54%	17%	17%
13	3	6%	2%	88%	4%
14	4	15%	41%	6%	38%
15	3	2%	2%	92%	4%
16	2	13%	78%	4%	5%
17	2	50%	11%	3%	36%
18	1	40%	16%	24%	20%
19	2	18%	64%	12%	6%
20	4	21%	28%	15%	36%
21	4	15%	9%	7%	69%
22	1	89%	5%	3%	3%
23	2	16%	62%	20%	2%
24	4	14%	7%	15%	64%
25	1	64%	17%	10%	8%
26	3	19%	6%	63%	12%
27	1	52%	17%	25%	6%
28	2	11%	52%	21%	16%
29	3	5%	37%	55%	3%
30	4	28%	44%	8%	20%
31	1	62%	23%	8%	7%
32	1	76%	7%	7%	10%
33	3	6%	35%	57%	2%
34	2	14%	74%	5%	7%
35	2	7%	62%	10%	21%
36	4	4%	11%	17%	68%
37	3	15%	10%	63%	12%
38	4	7%	5%	25%	63%
39	3	6%	11%	58%	25%
40	4	14%	22%	21%	43%

වගුව 6

එක් එක් ප්‍රශ්නය යටතේ **නිවැරදි වරණය** තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය **අඳුරු** කර දක්වා ඇත.

2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ප්‍රශ්න පත්‍රයෙහි 1-20 දක්වා ප්‍රශ්න ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයෙන් ද, 21-40 දක්වා ප්‍රශ්න ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයෙන් ද සමන්විත විය. සමස්තයක් ලෙස ගත් විට ගිණුම්කරණය ප්‍රශ්නවලට වඩා ව්‍යාපාර අධ්‍යයනය ප්‍රශ්නවලට වැඩි පිරිසක් නිවැරදි ව පිළිතුරු සපයා තිබුණි. එය 5%ක වැඩිවීමකි.

ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලින් ප්‍රශ්න අංක 8, 10, 14, 17, 18, 20 ප්‍රශ්න හැර අනෙකුත් සියලු ම ප්‍රශ්නවලට අපේක්ෂකයින්ගෙන් 50%ට වඩා වැඩි ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා තිබුණි. ප්‍රශ්න අංක 8 හා 10 ප්‍රශ්න සකස් වී තිබුණේ. 'ව්‍යාපාර සැලැස්මක අන්තර්ගතය' ඇසුරෙනි. ව්‍යාපාර සැලැස්මක අන්තර්ගතය පිළිබඳ ව අපේක්ෂකයින් තුළ නිසි අවබෝධයක් නොතිබීම, නිවැරදි පිළිතුරු අඩුවීමට හේතුවක් විය හැකි ය. ප්‍රශ්න අංක 14 සඳහා නිවැරදි පිළිතුරු සැපයූ සංඛ්‍යාව අඩුවීමට හේතු වී තිබුණේ ඔවුන්ට චෙක්පත් භාවිතය සම්බන්ධ අවබෝධය අඩුවීම විය හැකි ය. ප්‍රශ්න අංක 17 සඳහා නිවැරදි පිළිතුරු සැපයූ සංඛ්‍යාව අඩුවී තිබීම තුළ රක්ෂ්‍ය හිමිකම පිළිබඳ ප්‍රායෝගික දැනුම අඩු බව පෙන්නුම් කරයි. ප්‍රශ්න අංක 20 සඳහා ද නිවැරදි පිළිතුරු සැපයූ සංඛ්‍යාව අඩුවීමට හේතු වී ඇත්තේ ව්‍යාපාර සංවිධාන හා කොටස් වෙළඳපොළ කටයුතු පිළිබඳ අවධානය යොමු නොකිරීමයි. න්‍යායාත්මක දැනුම ලබාදීමේදී ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ අවබෝධය ද ලබාදීම තුළින් ඉහත හඳුනාගත් අඩුපාඩු අවම කර ගත හැකි ය.

ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රයට අදාළ වූ අංක 30 ප්‍රශ්නයට හැර අනෙකුත් සියලු ම ප්‍රශ්නවලට අපේක්ෂකයින්ගෙන් 50%ට වඩා වැඩි පිරිසක් නිවැරදි පිළිතුරු සපයා තිබිණි. එම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති ආකාරය අනුව පෙනී යන්නේ, අපේක්ෂකයින්ට වාර්ෂික සාමාජික මුදල් ප්‍රමාණය පිළිබඳ ව හා හිඟ සාමාජික මුදල් හඳුනාගැනීම පිළිබඳ ව අවබෝධය අඩු බවත්, එසේම, අවධානයෙන් යුතුව ප්‍රශ්න කියවා පිළිතුරු සැපයීම පිළිබඳ පුහුණුව ලැබී නොමැති බවත් ය.

ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රවලින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නවලින් අපේක්ෂකයින් අඩු සාධන මට්ටමක් පෙන්වා ඇත්තේ ප්‍රායෝගික තත්ත්වයක් තුළ න්‍යායාත්මක කරුණු ඇගයීමට ලක්කළ ප්‍රශ්නවලට නිසා අදාළ විෂයය කොටස් ඉගැන්වීමේ දී ගුරුවරයා න්‍යායාත්මක කරුණු ප්‍රායෝගික ප්‍රවේශයකින් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් ඇත.

2.2. II ප්‍රශ්න පත්‍රය

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ★ **කාලය පැය 02යි.** (ප්‍රශ්න පත්‍රයට නියමිත පැය තුනක (03) කාලයෙන් පැය දෙකක් (02) II ප්‍රශ්න පත්‍රය සඳහා යොදා ගැනීම අපේක්ෂා කෙරිණි.)
- ★ II ප්‍රශ්න පත්‍රයේ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්යය වන අතර, I හා II කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු වේ.
- ★ 1 ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් යුක්ත වන අතර, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂය ක්ෂේත්‍රවලට සමාන බර තැබීමකින් යුක්ත වේ.
- ★ I කොටස ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයට අදාළ ව්‍යුහගත ප්‍රශ්න 3කින් හා II කොටස ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයට අදාළ ව්‍යුහගත ප්‍රශ්න 3කින් සමන්විත වේ.
- ★ 1 ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 02 බැගින් ලකුණු **20**ක් ද, I හා II කොටස්වල එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු **40**ක් ද හිමි වේ.
- ★ II ප්‍රශ්න පත්‍රය සඳහා හිමි අවසාන ලකුණු **60**කි.

2.2.2. **II** ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3, 4 හා 5 ඇසුරෙන් සකස් කර ඇත. අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

1 ප්‍රශ්නය

1. ● පහත සඳහන් ඡේදය ඇසුරෙන් අංක (i) සිට (v) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිස් **අවශ්‍යතා** හා **වුවමනා** තෘප්තිමත් කිරීම උදෙසා **භාණ්ඩ** හා **සේවා** නිපදවීමට කටයුතු කරන සංවිධාන ව්‍යාපාර ලෙස හඳුන්වයි. මෙම සියලු ව්‍යාපාරවල අයිතිය **පුද්ගලයින්** හෝ **රජය** සතු වේ. සියලු ව්‍යාපාර කිසියම් ආකාරයක ව්‍යාපාර කටයුත්තක නියැළෙන අතර ඒ සඳහා **සම්පත් හෙවත් නිෂ්පාදන සාධක** භාවිත කරයි. එසේම මෙම සියලු ව්‍යාපාර **ප්‍රාථමික, ද්විතීයික** හා **තෘතීයික** වශයෙන් වර්ග කර දක්විය හැකි ය.

(i) ඔබගේ අවශ්‍යතා **හතරක්** දක්වෙන ලැයිස්තුවක් පිළියෙල කර, ඒ ඒ අවශ්‍යතාවට අදළ වන ඔබගේ වුවමනාව බැගින් සඳහන් කරන්න.

(ii) භාණ්ඩ හා සේවා අතර කෙබඳු වෙනස්කම් ඔබ දකින්නේ ද?

(iii) පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුන් **දෙක** බැගින් ලියන්න.

(iv) ව්‍යාපාර කටයුතු සඳහා භාවිත කරන නිෂ්පාදන සාධක **හතරක්** නම් කරන්න.

(v) ප්‍රාථමික ව්‍යාපාර සහ තෘතීයික ව්‍යාපාර වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.

● පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක (vi) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පහන් 2012.01.01 දින පලතුරු මිලදී ගෙන විකිණීම සඳහා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, 2012 ජනවාරි මාසයේ එම ව්‍යාපාරයේ මුදල් පොත පහත පරිදි වේ.

මුදල් පොත

දිනය	ල.අං.	විස්තරය	ස.පි.	මුදල්	දිනය	ව.අං.	විස්තරය	ස.පි.	මුදල්
2012.01.01	001	ප්‍රාග්ධනය	01	250 000	2012.01.02	001	පලතුරු ගැනුම්	02	40 000
2012.01.10	002	විකුණුම්	03	50 000	2012.01.05	002	මෝටර් රථය	04	170 000
2012.01.15	003	බැංකු ණය	05	30 000	2012.01.07	003	ශීතකරණය	06	50 000
					2012.01.28	004	වැටුප්	07	5 000
					2012.01.29	005	ගොඩනැගිලි කුලී	08	2 500
					2012.01.31		ශේෂය ප/ගෙ		62 500
				330 000					330 000
2012.02.01		ශේෂය ඉ/ගෙ		62 500					

ජනවාරි මාසයට අදළව පහත සඳහන් තොරතුරු සපයා ඇත.

- 2012.01.03 දින සුදත්ගෙන් ණයට ගැනුම් රු. 5 000
- 2012.01.19 දින ගාමිණීට ණයට විකුණුම් රු. 22 000
- ජනවාරි මාසය සඳහා උපචිත බැංකු ණය පොළිය රු. 300

එසේම, මුදල් පොතේ ශේෂය සැලකිල්ලට ගනිමින් ජනවාරි මාසය තුළ රු. 62 500 ක ශුද්ධ ලාභයක් ලබා ඇති බව පහන් සඳහන් කරයි.

(vi) 2012.01.01 දිනට පහන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයයන් සමඟ ලියා දක්වන්න.

(vii) මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ කටයුතු සඳහා භාවිත කළ යුතු මූලික පොත් **හතරක්** නම් කරන්න.

(viii) මෙම ව්‍යාපාරයේ පොදු ලෙජරයේ දැකිය හැකි වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ගිණුම් සඳහා නිදසුන බැගින් ලියන්න.

(ix) මෙම ව්‍යාපාරය 2012.01.31 න් අවසන් මාසය සඳහා උපයා ඇති ශුද්ධ ලාභය ගණනය කර දක්වන්න.

(x) මෙම ව්‍යාපාරය ජනවාරි මාසය තුළ රු. 62 500 ක ශුද්ධ ලාභයක් ලබා ඇතැයි පහන් කර ඇති ප්‍රකාශය පිළිබඳ ව ඔබට කුමක් කිව හැකි ද?

(ලකුණු 02 × 10 = 20 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

01. (i)

අවශ්‍යතා	වුවමනා
• ආහාර	බත්, පාන් වැනි දෑ ඕනෑම පානයක්
• ඇඳුම් (Clothing)	කලිසම්, ගවුම්, සපත්තු යනාදිය
• නිවාස	තට්ටු නිවාස, මහල් නිවාස, ගෙවල් යනාදිය
• අධ්‍යාපනය	පාසැල්, විශ්ව විද්‍යාල, පොත්පත් යනාදිය
• සෞඛ්‍යය	බෙහෙත්, වෛද්‍යවරු, රෝහල් යනාදිය
• ආරක්ෂාව	ආරක්ෂණ සේවා, රක්ෂණය, රැකියාව
• සන්නිවේදනය	දුරකථනය, e-male, ජංගම දුරකථන යනාදිය
• ප්‍රවාහනය	බයිසිකල්, බස්රථ, ලොරි

★ අවශ්‍යතා හා වුවමනා 4ක් නිවැරදිව දක්වා ඇත්නම් (ලකුණු 1/2 × 4 = 02)

★ අවශ්‍යතා පමණක් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු නැත

(ii)

භාණ්ඩ	සේවා
• ස්පර්ශ කළ හැක/භෞතික පැවැත්මක් ඇත	ස්පර්ශ කළ නොහැක/භෞතික පැවැත්මක් නැත
• භාණ්ඩ, සපයන්නාගෙන් වෙන්කළ හැක	සේවා, සපයන්නාගෙන් වෙන් කළ නොහැක
• ගබඩා කළ හැක/ නිෂ්පාදනය හා පරිභෝජනය එකවර සිදු නොවේ.	ගබඩා කළ නොහැක/ නිෂ්පාදනය හා පරිභෝජනය එකවර සිදුවේ.
• භාණ්ඩ ඒකාකාරය.	සේවා විවිධය.

★ වෙනස්කමකට 1 බැගින් කරුණු දෙකකට ලකුණු 02 (ලකුණු 1 × 2 = 02)

(iii) පෞද්ගලික අංශය :- තනි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමූපකාර, සමිති ව්‍යාපාර

(ලකුණු 1/2 බැගින් නිදසුන් 2 කට ලකුණු 01 යි.)

රාජ්‍ය අංශය :- රාජ්‍ය සංස්ථා, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සමාගම්, පළාත් පාලන ආයතනවලට අයත් ව්‍යාපාර

(ලකුණු 1/2 බැගින් නිදසුන් 2 කට ලකුණු 01 යි.)

සැලකිය යුතුයි :- ව්‍යාපාර සංවිධානවලට අදාළ ව නිදසුන් ඉදිරිපත් කළත් ලකුණු හිමිවේ.

උදා :- මලීගේ මල්සැල

ලංකා විදුලිබල මණ්ඩලය

(iv) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

හෝ

භූමිය	-	අමුද්‍රව්‍ය, ස්වභාවික සම්පත් යනාදිය	-	භෞතික සම්පත්
ශ්‍රමය	-	සේවකයින්/කළමණාකරුවන්	-	මානව සම්පත්
ප්‍රාග්ධනය	-	අරමුදල්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ යනාදිය	-	මූල්‍ය සම්පත්
ව්‍යවසාය	-	හිමිකරු, සංවිධාන කටයුතු	-	සංවිධානය
කාලය	-			
තොරතුරු	-			
දැනුම (තාක්ෂණය)	-			

(ලකුණු 1/2 × 4 = 02)

(v) ස්වභාවධර්මයෙන් ලැබී ඇති සම්පත් පවත්නා ආකාරයෙන්ම උකහා ගන්නා කර්මාන්ත ප්‍රාථමික ව්‍යාපාර වේ.

(ලකුණු 01 යි)

වෙළෙඳාම හා වෙළෙඳාමට උපකාර වන සේවා තෘතීයික ව්‍යාපාර වේ.

★ තෘතීයික ව්‍යාපාර, වාණිජ්‍යය හෝ සේවා ව්‍යාපාර ලෙස ද හැඳින්වේ.

(ලකුණු 01 යි)

(vi) වත්කම් = ප්‍රාග්ධනය (හිමිකම) + වගකීම

රු.250 000 = රු.250 000 + ..--..

හෝ

වත්කම් = ප්‍රාග්ධනය (හිමිකම)

රු.250 000 රු.250 000

(ලකුණු 02 යි)

(vii) මුදල් පොත

ගැනුම් ජ'නලය

විකුණුම් ජ'නලය

පොදු ජ'නලය

(ලකුණු 1/2 × 4 = 02)

(viii) වත්කම් ගිණුම්	=	මෝටර් රථ ගිණුම, ශීතකරණ ගිණුම, මුදල් ගිණුම, ණයගැති ගිණුම/ගාමිණීගේ ගිණුම
වගකීම් ගිණුම්	=	බැංකු ණය ගිණුම, ණය හිමි ගිණුම/සුදත්ගේ ගිණුම, උපචිත ණය පොලී ගිණුම
ආදායම් ගිණුම්	=	විකුණුම් ගිණුම, (පළතුරු විකුණුම් ගිණුම)
වියදම් ගිණුම්	=	වැටුප් ගිණුම, බැංකු ණය පොලී ගිණුම, ගොඩනැගිලි කුලී ගිණුම, ගැනුම් ගිණුම

ලකුණු 1/2 බැගින් ගිණුම් 4කට ලකුණු 02 යි.

(ලකුණු 1/2 × 4 = 02)

(ix) ආදායම් ප්‍රකාශය

විකුණුම් (50 000 + 22 000)		72 000	(1/2)
ගැනුම් (40 000 + 5 000)		(45 000)	(1/2)
දළ ලාභය		27 000	
අඩු කළා - වැටුප්	5 000		
ගොඩනැගිලි කුලී	2 500		
බැංකු ණය පොළී	300		
		(7 800)	(1/2)
ශුද්ධ ලාභය		19 200	(1/2)

(ලකුණු 02 යි)

★ ශුද්ධ ලාභය රු.19 200 පමණක් ඇත්නම් ලකුණු 1/2 යි.

(x) * මුදල් පොතේ ශේෂය ශුද්ධ ලාභය නොවේ.
* පහත්ගේ ප්‍රකාශය වැරදිය.

(ලකුණු 02 යි)
(මුළු ලකුණු 20 යි)

1 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

1 වන ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය



ප්‍රස්තාරය 7

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 15%ක් ද, ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 27%ක් ද, ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 38%ක් ද, ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 20%ක් ද, වශයෙන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 20%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 42%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට වඩා අඩුවෙනි.



ප්‍රස්තාරය 8

මෙම ප්‍රශ්නය කොටස් 10කින් සමන්විත අතර, i කොටසෙහි පහසුතාව 91%කට ආසන්න වන අතර ix කොටසෙහි පහසුතාව 13%කට ආසන්න වේ.

1 වන ප්‍රශ්නයට ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂය ක්ෂේත්‍ර දෙකෙන් ම ප්‍රශ්න ඇතුළත් විය. මෙම අනිවාර්යය ප්‍රශ්නයට සියලු ම අපේක්ෂකයින් පිළිතුරු සපයා තිබුණි. අවශ්‍යතා හා වුවමනා හඳුනා ගැනීම සම්බන්ධයෙන් ඉහළ සාධන මට්ටමක් පෙන්නුම් කරන බව පළමුවන ප්‍රශ්නයේ (i) වන කොටසට 91%ක ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සැපයීමෙන් පෙනී යයි. ප්‍රශ්නයේ (iv) වන කොටස හා (ix) වන කොටස හැර ඉතිරි ප්‍රශ්න සියල්ල සඳහා අපේක්ෂකයින්ගෙන් 40% කට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා තිබුණි. (iv) වන කොටස සඳහා අදාළ වන නිෂ්පාදන සාධක හෙවත් යෙදවුම් සම්බන්ධ ව නිවැරදි අවබෝධයක් අපේක්ෂකයින් තුළ නොමැති බව මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති ආකාරයෙන් දැකිය හැකි ය. පළමු වන ප්‍රශ්නයේ ix වන කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 13%ක සංඛ්‍යාවකි. මුදල් පොතට අමතර ව සපයා තිබූ අනෙකුත් තොරතුරු පිළිබඳ ව සැලකිල්ලක් නොදැක්වීම එයට හේතුව විය හැකි ය. පන්ති කාමර ක්‍රියාකාරකම් තුළින් මෙම නිපුණතාව ප්‍රගුණ කළ යුතු ය.

2 ප්‍රශ්නය

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) සී/ස සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත සමඟ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ධනපාල, පාරිභෝගික ඇණවුම්වලට අනුව විශේෂිත වර්ගයක අල්මාරි නිෂ්පාදනය කරයි. ඔහුගේ වඩු මඩුවේ වඩු කාර්මිකයකු හා මුරකරුවකු සේවයේ නිරත වී සිටිති.

පහත දැක්වෙන්නේ 2013 ජනවාරි මාසයේ ඇණවුම් සඳහා අල්මාරි නිෂ්පාදනයේ දී දැරීමට සිදුවන වියදම් ඇස්තමේන්තුවකි.

* ලී (අල්මාරියක් සඳහා)	රු.	10 000
* වඩු කාර්මික වැටුප් (අල්මාරියක් සඳහා)	රු.	6 000
* වඩු මඩුවේ කුලිය (මසකට)	රු.	5 000
* මුරකරුගේ වැටුප (මසකට)	රු.	10 000
* වැලි කඩදාසි, ඇණ, වර්ණ ආදී වක්‍ර ද්‍රව්‍ය වියදම (මසකට)	රු.	5 000

2013 ජනවාරි මාසය සඳහා අල්මාරි 4 ක් සඳහා ඇණවුම් ලැබී ඇත.

(අ) අල්මාරි නිෂ්පාදනයේ දී දැරීමට සිදුවන, මෙහි දැක්වෙන සෘජු වියදම් දෙකක් හා වක්‍ර වියදම් දෙකක් සඳහා නිදසුන් දක්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) එක් අල්මාරියක ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය ගණනය කරන්න. *(ලකුණු 02 යි)*

(ඉ) 2013 ජනවාරි මාසය සඳහා වඩු මඩුවේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ගණනය කරන්න. *(ලකුණු 02 යි)*

(ඊ) එක් අල්මාරියක ඇස්තමේන්තුගත මුළු පිරිවැය ගණනය කරන්න. *(ලකුණු 02 යි)*

(මුළු ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

2. (i)
- යෝජිත නම පිළිබඳ ප්‍රකාශය
- සාංගමික ව්‍යවස්ථාවලිය
- අධ්‍යක්ෂකවරුන්ගේ කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශය
- ලේකම් ලෙස කටයුතු කිරීමට කැමැත්ත දක්වන ප්‍රකාශය

(ලකුණු ½ × 4 = 02 යි)

(ii) (අ) සෘජු වියදම් = ලී, වඩු කාර්මික වැටුප (ලකුණු ½ × 2 = 01 යි)

වක්‍ර වියදම් = වඩු මඩුවේ කුලිය, මුරකරුගේ වැටුප, වැලි කඩදාසි, ඇණ, වර්ණ ආදී වක්‍ර ද්‍රව්‍ය වියදම් (ලකුණු ½ × 2 = 01 යි)

(ආ) ප්‍රාථමික පිරිවැය = 10 000 + 6 000 = 16 000
(ලකුණු 1/2) (ලකුණු 1/2) (ලකුණු 1) **(ලකුණු 02 යි)**

(ඉ) මුළු පිරිවැය :- ලී සඳහා (10 000 × 4) = 40 000
වඩු කාර්මික වැටුප (6 000 × 4) = 24 000
64 000 (½)

වඩු මඩුවේ කුලී	5 000
මුරකරු වැටුප	10 000 (½)
වක්‍ර ද්‍රව්‍ය වියදම්	5 000
	84 000 (01)

(ලකුණු 02 යි)

(ඊ) මුළු පිරිවැය / නිෂ්පාදිත අල්මාරි ගණන = 84 000 / 04 — ලකුණු (01) යි
එක් අල්මාරියක පිරිවැය = 21 000 — ලකුණු (01) යි

(ලකුණු 02 යි)
(මුළු ලකුණු 10 යි)

2 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රස්තාරය 9

2 වන ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 60%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 25%ක් ද, හා
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 23%ක් ද, වශයෙන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 23%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 18%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.



ප්‍රස්තාරය 10

මෙම ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් 5ක් ඇති අතර ii (අ) අනුකොටසෙහි පහසුතාව 88%කට ආසන්න වන අතර i කොටසෙහි පහසුතාව 40%කට ආසන්න වේ.

මෙම ප්‍රශ්නයේ (i) කොටස "ව්‍යාපාර ආරම්භ කිරීම" නිපුණතාව තුළින් සකස් කර තිබිණ. නමුත් මේ සඳහා නිවැරදි ව පිළිතුරු සපයා තිබුණේ 40%කි. මෙම කොටස සඳහා අදාළ පිළිතුර 10 ශ්‍රේණිය පෙළපොතෙහි ඍජුව ම සඳහන් ව තිබුණි. මෙයින් පෙන්නුම් කරන්නේ පෙළපොත පරිශීලනය කිරීම සඳහා යොමු කිරීමේ අවශ්‍යතාවක් පවතින බව ය.

සිද්ධි අධ්‍යයනයට අදාළ ව අනු අංක (ii) (අ), (ආ) සඳහා නිවැරදි ව පිළිතුරු සපයා තිබීමට හේතු වූයේ සිද්ධියට අදාළ ව ඍජු හා වක්‍ර වියදම් පැහැදිලි ව හඳුනාගෙන තිබීමයි. (ii) හි අනු අංක (ඉ) හා (ඊ) කොටස් සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබූ ප්‍රතිශතය අඩුවීමට හේතුව වූයේ ප්‍රාථමික පිරිවැය ගණනයේ දී මුළු නිෂ්පාදනය පිළිබඳ ව අවධානය යොමු නොකිරීමයි. එම නිසා ප්‍රායෝගික ක්‍රියාකාරකම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වන අතර, එමගින් නිෂ්පාදන පිරිවැය වර්ග හඳුනා ගැනීමට සහ ගණනය කිරීමට සිසුන් පුහුණු කළ යුතු ය.

3 ප්‍රශ්නය

3. **(i)** **වාණිජ බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයෙකුට ලැබිය හැකි වාසි හතරක් සඳහන් කරන්න.** *(ලකුණු 02 යි)*

(ii) **පහත දක්වෙන ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.**

- **(අ)** **හරපතක් ලබා ගැනීම සඳහා බැංකුවක ගිණුමක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ.**
- **(ආ)** **හානිපූරණය යනු රක්ෂණ මූලධර්මයකි.**
- **(ඉ)** **ව්‍යාපාර සැලැස්මක ඇතුළත් කරනුයේ ව්‍යාපාරයේ සිදු වූ ආදායම් හා වියදම් ය.**
- **(ඊ)** **විශේෂ රේඛනයේ දී චෙක්පත මත බැංකුවක නමක් සඳහන් කෙරේ.** *(ලකුණු 02 යි)*

(iii) **වර්තමානයේ ණයපත් භාවිතය ප්‍රචලිත වෙමින් පවතී. ණයපත් භාවිතයෙන් ගනුදෙනුකරුට ලැබිය හැකි ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.** *(ලකුණු 02 යි)*

(iv) **වාචික, ලිඛිත, විද්‍යුත් හා සංකේත යන සන්නිවේදන මාධ්‍ය යටතේ යොදා ගන්නා සන්නිවේදන ක්‍රම එක බැගින් සඳහන් කරන්න.** *(ලකුණු 02 යි)*

(v) **ක්‍රමවත් ගබඩාකරණ පද්ධතියක් නොමැති වුවහොත් ව්‍යාපාරිකයෙකුට සිදු විය හැකි අහිතකර ප්‍රතිවිපාක හතරක් සඳහන් කරන්න.** *(ලකුණු 02 යි)*

(මුළු ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

3. (i)
- චෙක්පත් මගින් ගනුදෙනු කළ හැකි වීම
- අයිරා පහසුකම් ලබාගැනීමට හැකිවීම
- තම ගිණුමට ප්‍රේෂණ රැස්කර ගැනීමට හැකිවීම
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කළ හැකි වීම

(ලකුණු ½ × 4 = 02 යි)

(ii)
- (අ) - අසත්‍යයයි
- (ආ) - සත්‍යයයි
- (ඉ) - අසත්‍යයයි
- (ඊ) - සත්‍යයයි

(ලකුණු ½ × 4 = 02 යි)

(iii)
- භාණ්ඩ හා සේවා ණයට ලබාගත හැකිවීම
- ATM යන්ත්‍ර මගින් යම් මුදල් ප්‍රමාණයක් වුවද ලබාගත හැකිවීම
- යම් කාලසීමාවක් තුළ පොළී රහිතව ද ණය ලබාගත හැකිවීම
- විශේෂ වට්ටම් සහන ලබාගැනීමට හැකිවීම
- මුදල් රැගෙන යාමේ අවදානම අඩුවීම
- ජාත්‍යන්තර ගනුදෙනු සඳහා භාවිත කළ හැකිවීම

(ලකුණු ½ × 4 = 02 යි)

(iv) වාචික = රැස්වීම්, සාකච්ඡා, වැඩමුලු,
ලිඛිත = ලිපි, දැන්වීම්, පත්‍රිකා, චක්‍රලේඛ, දැන්වීම් පුවරු, වාර්තා
විද්‍යුත් = රූපවාහිනිය, ගුවන්විදුලිය, ශබ්ද විකාශන යන්ත්‍ර, වීඩියෝපට, දුරකථන, විද්‍යුත් තැපැල, ෆැක්ස්
සංකේත = මාර්ග සංඥා, හැසිරවීමේ සංඥා, ඇසුරුම් සංකේත

(උදාහරණයකට ½ × 4 = 02 යි)

(v)
- ව්‍යාපාර කටයුතු අඩපණ වීම
- ගනුදෙනුකරුවන් කලකිරීමට පත්වීම
- ආයතනයේ කීර්තිනාමය පලුදුවීම
- අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදුවීම
- තොග වැඩිපුර තබා ගැනීම මගින් සිදුවන ප්‍රතිවිපාක

(ලකුණු ½ × 4 = 02 යි)
(මුළු ලකුණු 10 යි)

3 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

3 වන ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය



ප්‍රස්තාරය 11

3 වන ප්‍රශ්නය 92%ක පිරිසක් තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයෙ 24%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 32%ක් ද, හා
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 38%ක්ද, වශයෙන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 38%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 6%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.



ප්‍රස්තාරය 12

මෙම ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් 8ක් ඇති අතර ii (අ), (ආ), (ඉ), (ඊ) කොටස්වල පහසුතාව 20%කට ආසන්න වන අතර iv අනුකොටසෙහි පහසුතාව 88%ක් වේ.

3 වන ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයින්ගෙන් 60%ක් නිවැරදි ව පිළිතුරු සපයා තිබුණි. මෙයින් පෙන්නුම් කරන්නේ ජංගම ගිණුමක ප්‍රායෝගික භාවිතය පිළිබඳ ව අපේක්ෂකයින්ගෙන් වැඩි පිරිසකට ඉහළ අවබෝධයක් ඇති බව ය. (ii) කොටසේ අ, ආ, ඉ හා ඊ යන අනුකොටස් සියල්ල සඳහා ම නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 20%කට වඩා අඩු සංඛ්‍යාවකි. ඒ අනුව පෙනී යන්නේ ඉදිරිපත් කර තිබූ ප්‍රකාශන පැහැදිලි ව ඉදිරිපත් කර තිබුණ ද අපේක්ෂකයින් තුළ විෂය කරුණු පිළිබඳ නිශ්චිත වැටහීමක් නොමැති බව ය. මෙවැනි ආකාරයේ අභ්‍යාස කෙරෙහි සිසුන් යොමු කිරීමෙන් ඔවුන්ගේ කුසලතා වර්ධනය කරගත හැකි ය.

මෙම ප්‍රශ්නයේ (iii) වන කොටසෙහි ණයපත් භාවිතයෙන් ගනුදෙනුකරුවෙකුට ලැබෙන ප්‍රතිලාභ වෙනුවට බොහෝ අපේක්ෂකයන් පිළිතුරු ඉදිරිපත් කර තිබුණේ ATM කාඩ්පත් භාවිතයෙන් ගනුදෙනුකරුවෙකුට ලැබෙන ප්‍රතිලාභයි. ණයපත් හා ATM කාඩ්පත් අතර වෙනස පැහැදිලි ව හඳුනා නොගැනීම මේ සඳහා බලපාන ප්‍රධාන හේතුවයි. 10 ශ්‍රේණිය පෙළ පොතෙහි "විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා" නමැති නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණු පරිශීලනය කිරීමෙන් විද්‍යුත් මුදල් පිළිබඳ ව අපේක්ෂකයින්ගේ නිවැරදි ආකල්ප ගොඩනැංවිය හැකි ය. (iv) වන කොටස සඳහා සාර්ථක ව පිළිතුරු සපයා තිබිණි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ව අපේක්ෂකයින්ගේ දැනුම හා අත්දැකීම් සාර්ථක ව පිළිතුරු සැපයීමට හේතුවී ඇත. (v) වන කොටස සඳහා අපේක්ෂකයින් වැඩි සංඛ්‍යාවක් සාර්ථක ව පිළිතුරු සැපයීමට හේතු වී තිබුණේ, ක්‍රමවත් ගබඩාකරණ පද්ධතියක් නොමැතිවීමෙන් මතුවන ගැටලු පිළිබඳ පැවති දැනුවත්භාවයයි.

සමස්තයක් ලෙස ගත් කල මෙම ප්‍රශ්නය තුළ න්‍යායාත්මක හා ප්‍රායෝගික කරුණු සංකලනයක් තිබෙන නිසා විෂය කරුණු සිසුන්ට අවබෝධ කරවීමේ දී ප්‍රායෝගික තත්ත්වයන් තුළ, න්‍යායාත්මක කරුණු පැහැදිලි කරදීම අවශ්‍ය වේ.

4 ප්‍රශ්නය

4. (i) රාමා හා සීතා විසින් හවුල් ව්‍යාපාරයක් කරගෙන යති. හවුල් ව්‍යාපාරයක් සඳහා ලබා ගත හැකි සියලු මූල්‍ය මාර්ග ඔවුන් විසින් යොද ගෙන තිබූ අතර, තවදුරටත් ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී තිබුණි. ඒ සඳහා තම ව්‍යාපාරය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට ඔවුන් තීරණය කරන ලදී.

(අ) හවුල් ව්‍යාපාරයක් ලෙස රාමා සහ සීතා විසින් උපයෝගී කරගෙන ඇතැයි සිතිය හැකි මූල්‍ය මාර්ග කවරේ දැයි සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් මූල්‍ය සම්පාදනය කරගත හැකි මාර්ග දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉතිරිකිරීමේ ගිණුමකට සාපේක්ෂව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(iii) මූල්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගැනීමේ දී ව්‍යාපාරිකයෙකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(iv) සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

(මුළු ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

4. (i) (අ)
- හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධනය
- හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයට අමතර ව සපයන ණය
- බැංකු හා වෙනත් මූල්‍ය ආයතනවලින් ලබාගන්නා ණය
- හිතවතුන්ගෙන් සපයාගන්නා ණය
- වෙළඳ ණය හිමියෝ
- බැංකු අයිරාව

(ලකුණු ½ × 04 = 02 යි)

(ආ)
- කොටස් නිකුත් කිරීම
- ණයකර නිකුත් කිරීම
- වාණිජ පත්‍ර නිකුත් කිරීම
- දිගු කාලීන බැංකු ණය ලබාගැනීම

★ (සඳහන් කිරීමට ලකුණු ½, පැහැදිලි කිරීමට ලකුණු ½ යි.) (ලකුණු 01 × 02 = 02 යි)

(ii)
- ස්ථාවර තැන්පතුවකට වැඩි පොළියක් ලබාගැනීමට හැකිවීම
- ස්ථාවර තැන්පතුව ඇපයට තබා ණය මුදලක් ලබාගත හැකිවීම
- පොළිය මාසිකව හෝ කල් පිරුණු පසු ව ගැනීමට හැකිවීම
- තැන්පතු කාලය වැඩිවන විට ඉහළ පොළී ප්‍රතිශතයක් ලැබීම

(ලකුණු 01 × 02 = 02 යි)

(iii)
- අවශ්‍යතාවයේ ස්වභාවය
- සුරැකුම් අවශ්‍යතා
- මූල්‍ය සැපයීම සම්බන්ධ කොන්දේසි
- ලබාගැනීමේ පහසුව
- බේරුම් කිරීමේ හැකියාව
- පිරිවැය
- ව්‍යාපාර සංවිධානයේ ස්වභාවය
- ආපසු ගෙවීමට ලබාදෙන කාලය
- ව්‍යාපාර කටයුතුවල ස්වභාවය

(ලකුණු 01 × 02 = 02 යි)

(iv)
- ලාභාංශ ලැබීම
- ප්‍රාග්ධන ලාභ
- හිමිකම් නිකුතුව (අයිතිවාසිකම් නිකුතුව)
- කොටස් වෙනත් අයෙකුට පවරා මුදල් බවට පත් කරගැනීමේ හැකියාව
- සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකිවීම
- වෙනත් ප්‍රතිලාභ

(සඳහන් කිරීමට ලකුණු ½, පැහැදිලි කිරීමට ලකුණු ½ යි.)

(ලකුණු 01 × 02 = 02 යි)
(මුළු ලකුණු 10 යි)

4 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

4 වන ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය



ප්‍රස්තාරය 13

4 වන ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 47%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 38%ක් ද, ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 32%ක් ද, ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 17%ක් ද, හා ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 13%ක් ද, වශයෙන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 13%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 70%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙනි.



ප්‍රස්තාරය 14

මෙම ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් 5ක් ඇති අතර (ii) හා (iii) කොටස්වල පමණක් පහසුතාව 50%ට වඩා වැඩි වේ. අනෙක් කොටස්වල පහසුතාව 50%ට වඩා අඩු ය.

04 වන ප්‍රශ්නය තෝරාගෙන තිබුණේ පෙනී සිටි අපේක්ෂකයින්ගෙන් 47%ක් පමණි. මෙය විෂය නිර්දේශයේ අවසාන නිපුණතාව වන "මූල්‍ය සම්පාදන මාර්ග හා ආයෝජන මාර්ග" ඇසුරෙන් ගොඩනගා තිබූ ප්‍රශ්නයකි. පිළිතුරු සැපයීමේ දී මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10න් 6 ක් හෝ ඊට වඩා ලබාගෙන තිබුණේ 30%ක් පමණි. මෙය සැලකිය යුතු තත්ත්වයකි. මූල්‍ය සම්පාදනයේ දී සැලකිලිමත් විය යුතු කරුණුත්, ආයෝජනයේ දී සැලකිලිමත් විය යුතු කරුණුත් පිළිබඳ නිසි අවබෝධයකින් කටයුතු නොකිරීම වැරදි පිළිතුරු ලබාදීමට හේතුවී තිබිණි. න්‍යායාත්මක කරුණු පිළිබඳ අවබෝධය අඩුවීමත් මෙය විෂය නිර්දේශයේ අවසාන නිපුණතාව වීමත් මෙයට හේතුවිය හැකි ය. එබැවින් මෙම නිපුණතාව හොඳින් ආවරණය කිරීමට සැලසුම් සහගත ව කටයුතු කළ යුතු ය. ඊට අමතර ව සිසුන් ව පුවත්පත් හා සඟරා කියවීමට යොමු කිරීම, බැංකු හා මූල්‍ය ආයතනවලින් නිකුත් කරන අත්පත්‍රිකා කියවීමට උනන්දු කරවීම වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදවීම අවශ්‍ය වේ.

5 ප්‍රශ්නය

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. **දිමුතු ටෙක්ස් ව්‍යාපාරයේ** ගිණුම් ලිපිකරු විසින් 2012 නොවැම්බර් මාසයට අදළ පහත සඳහන් මූලාශ්‍ර ලේඛන ඔබට ඉදිරිපත් කර ඇත.

ඉන්වොයිසිය
අංකය : 501

කැලුම් රෙදි වෙළෙන්දෝ
අංක 10, නුවර පාර
ගම්පොල

2012.11.08

කළමනාකරු,
දිමුතු ටෙක්ස්,
මහනුවර

අ.අං	විස්තරය	ප්‍රමාණය	ඒකකයක මිල (රු.)	වටිනාකම (රු.)
01	අත් පිස්නා	50	60	3 000
02	මේස රෙදි	20	200	4 000
				7 000
	අඩු කළ වට්ටම 5%			(350)
				6 650

(අත්සන)
....
කළමනාකරු

ඉන්වොයිසිය **සුවසළු වෙළෙන්දෝ**
අංකය : 0014 **අංක 20, කොළඹ පාර** 2012.11.20
මාවනැල්ල

කළමනාකරු,
දිමුතු ටෙක්ස්,
මහනුවර

අ.අං	විස්තරය	ප්‍රමාණය	ඒකකයක මිල (රු.)	වටිනාකම (රු.)
01	සුදු පොප්ලින්	100 m	90	9 000
02	සුදු පොලියෙස්ටර්	150 m	100	15 000
				24 000
	අඩු කළ වට්ටම 10%			(2 400)
				21 600

(අත්සන)
....
කළමනාකරු

හරපත **දිමුතු ටෙක්ස්**
අංකය : 314 **අංක 10, කෙලින් වීදිය** 2012.11.10
මහනුවර

කළමනාකරු,
කැලුම් රෙදි වෙළෙන්දෝ
ගම්පොළ

2012.11.08 දින ඉ.අංක 501 යටතේ ගත් භාණ්ඩ ආපසු යැවීම.

අ.අං	විස්තරය	ප්‍රමාණය	ඒකකයක මිල (රු.)	වටිනාකම (රු.)
01	අත් පිස්නා	20	60	1 200
	අඩු කළ වට්ටම 5%			(60)
				1 140

වර්ගය වෙනස් වීම

(අත්සන)
....
කළමනාකරු

හරපත
අංකය : 315

දිමුතු ටෙක්ස්
අංක 10, කෙළින් වීදිය,
මහනුවර

2012.11.23

කළමනාකරු,
සුවසළු වෙළෙන්දෝ,
මාවනැල්ල

2012.11.20 දින ඉ.අංක 0014 යටතේ ගත් භාණ්ඩ ආපසු යැවීම.

අ.අං	විස්තරය	ප්‍රමාණය	ඒකකයක මිල (රු.)	වටිනාකම (රු.)
01	සුදු පොලියෙස්ටර් අඩු කළ වට්ටම 10%	50 m	100	5 000 (500) 4 500

වැඩිපුර එවා තිබීම

(අත්සන)
....
කළමනාකරු

(i) දිමුතු ටෙක්ස් හි ඉහත සඳහන් මූලාශ්‍ර ලේඛනවල තොරතුරු සටහන් කළ යුතු මූලික පොත් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉහත මූලාශ්‍ර ලේඛනවල සඳහන් ගනුදෙනු මූලික පොත්වල සටහන් කර පෙන්වන්න. *(ලකුණු 05 යි)*

(iii) ඔබ මූලික පොත්වල සටහන් කළ ගනුදෙනු ලෙජර් ගිණුම්වල ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(මුළු ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

5. (i) * ගැනුම් ජ'නලය (ලකුණු 01 යි)
 * ආපසු යැවුම් ජ'නලය (ලකුණු 01 යි)
 (ලකුණු 1 × 2 = 02)

(ii) ගැනුම් ජ'නලය

දිනය	ඉන්වොයිස් අංකය	සැපයුම්කරු	මුළු වටිනාකම රු.	ලෙ.පි.	
2012.11.08	501	කැලුම්	6 650		(01)
2012.11.20	0014	සුවසුළු	21 600		(01)
2012.11.30		ගැණුම් ගිණුමට හර කලා (½)	28 250		

ආපසු යැවුම් ජ'නලය

දිනය	හරපත් අංකය	සැපයුම්කරු	මුළු වටිනාකම රු.	ලෙ.පි.
2012.11.10	314	කැලුම් (වර්ගය වෙනස් වීම)	1 140	(01)
2012.11.23	315	සුවසුළු (වැඩිපුර ඒවා තිබීම)	4 500	(01)
2012.11.30		ආපසු යැවුම් ගිණුමට බැර කලා (½)	5 640	

(ලකුණු 05 යි)

(iii)

ගැණුම් ගිණුම

		රු.			රු.
11/30	ණය හිමියෝ (½)	28 250	11/30	ශේෂය ප/ගෙ	28 250
		28 250			28 250
	ශේෂය ඉ/ගෙ	28 250			

ආපසු යැවුම් ගිණුම

		රු.			රු.
11/30	ශේෂය ප/ගෙ	5 640	11/30	ණය හිමියෝ (½)	5 640
		5 640			5 640
			12/01	ශේෂය ඉ/ගෙ	5 640

කැලුම් වෙළෙන්දෝ

		රු.			රු.
11/10	ආපසු යැවුම් ගිණුම (½)	1 140	11/30	ණය හිමියෝ (½)	6 650
11/30	ශේ/ප/ගෙ	5 510			
		6 650			6 650
			12/01	ශේෂය ඉ/ගෙ	5 510

සුවසුළු වෙළෙන්දෝ

		රු.			රු.
11/23	ආපසු යැවුම් ගිණුම (½)	4 500	11/20	ගැණුම් ගිණුම (½)	21 600
11/30	ශේ/ප/ගෙ	17 100			
		21 600			21 600
			12/01	ශේෂය ඉ/ගෙ	17 100

* ගිණුම් 4හි සටහන් 6ට ලකුණු බැගින් ½ ලකුණු 03 යි **(ලකුණු ½ × 6 = 3)**

(මුළු ලකුණු 10 යි)

5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රස්තාරය 15

5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 52%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 43%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 15%ක් ද, හා
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 25%ක් ද, වශයෙන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 25%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 43%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.



ප්‍රස්තාරය 16

මෙම ප්‍රශ්නයෙහි කොටස් 3ක් ඇත. i කොටසෙහි පහසුතාව 75%ක් වන අතර iii කොටසෙහි පහසුතාව 40%කි.

5 වන ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයනගෙන් 75%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අභ්‍යාසයට අදාළ මූලාශ්‍ර ලේඛන තුළින් මූලික පොත් නිවැරදි ව හඳුනා ගෙන තිබීම මෙයට හේතුවයි. ගනුදෙනු සඳහා අදාළ මූලාශ්‍ර ලේඛන හා මූලික පොත් තවදුරටත් නිවැරදි ව අධ්‍යයනය කිරීම තුළින් මෙම නිපුණතාව සංවර්ධනය කරගත හැකි ය. නමුත් එම ප්‍රශ්නයේ ම (ii) වන කොටස සඳහා නිවැරදි පිළිතුරු සැපයූ ප්‍රතිශතය 58%ක් වීමෙන් නිරූපණය වන්නේ, මූලාශ්‍ර ලේඛන හා මූලික පොත් පිළිබඳ දැනුම තිබුණ ද සැලකිය යුතු පිරිසකට ඒවා ප්‍රායෝගික ව යොදා ගැනීම පිළිබඳ අවබෝධය නොමැති බවයි. එසේම මූලික පොත්වල නිවැරදි ආකෘතිය පිළිබඳ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් ද පෙන්නුම් කරයි. 11 ශ්‍රේණිය පෙළ පොතෙහි “මූලික පොත්” පිළිබඳ නිපුණතාව නිසි පරිදි අධ්‍යයනය කිරීමෙන් ද, මූලික පොත්වලට අදාළ ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරවීමෙන් ද මෙම නිපුණතාව වර්ධනය කරගත හැකි ය.

මෙම ප්‍රශ්නයේ (iii) වන කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 40% ක් පමණි. මූලික පොත්වලින් ලෙජරයට ඇතුළත් කළයුතු වටිනාකම් නිවැරදි නොවීම ද, ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන් නිවැරදි නොවීම ද මේ සඳහා බලපෑ ප්‍රධාන හේතු වේ. එමනිසා පෙළ පොත පරිශීලනය කිරීමත් අදාළ ක්‍රියාකාරකම්වල යෙදීමත් තුළින් මෙම නිපුණතාව ප්‍රගුණ කළ යුතු ය.

6 ප්‍රශ්නය

6. රන්සිරිගේ ව්‍යාපාරයේ 2012.03.31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම තුලනය නොවූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කොට තාවකාලිකව තුලනය කරන ලදී.

2012.03.31 දිනට ශේෂ පිරික්සුම

	හර (රු.)	බැර (රු.)
ප්‍රාග්ධනය		500 000
තොගය (2011.04.01 දිනට)	60 000	
ගැනුම්	355 000	
විකුණුම්		430 000
වේතන	45 000	
ලී බඩු	70 000	
රක්ෂණ ගාස්තු	5 000	
ඉඩම් හා ගොඩනැගිලි	280 000	
ණය ගැතියෝ	50 000	
ණය හිමියෝ		20 000
මුදල්	80 000	
අවිනිශ්චිත ගිණුම	5 000	
	950 000	950 000

පසුව ගිණුම් පොත් පරීක්ෂාවෙන් පහත දැක්වෙන වැරදි අනාවරණය විය.

(i) සුදත්ගෙන් ලබා ගත් රු. 2 000 ක බඩු තොගය පිළිබඳව කිසිදු සටහනක් නොමැත.

(ii) රු. 1 200 ක ගෙවූ රක්ෂණ ගාස්තු, රක්ෂණ ගිණුමේ 2 100 ක් ලෙස සටහන් කර ඇත.

(iii) රු. 5 000 ක ලී බඩු අලුත්වැඩියා වියදම, ලීබඩු ගිණුමට හර කර ඇත.

(iv) රු. 5 900 ක ණයට විකුණුම්, විකුණුම් ගිණුමේ නිවැරදි ව සටහන් කර ඇතත් අදළ ණය ගැති ගිණුමට හර කර **නොමැත.**

අවශ්‍ය වන්නේ,

(1) ඉහත වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්

(2) අවිනිශ්චිත ගිණුම

(3) වැරදි නිවැරදි කිරීමෙන් පසු 2012.03.31 දිනට ශේෂ පිරික්සුම *(මුළු ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

6. (1) පොදු ජ'නලය

දිනය	විස්තරය	හර	බැර	
03/31	ගැණුම් ගිණුම හර සුදත් (ණය හිමි ගිණුම) [සුදත්ගෙන් ණයට ගැනුම් පොත්වල සටහන් නොවීමේ වරද නිවැරදි කිරීම]	2 000	2 000	(01)
	අවිනිශ්චිත ගිණුම හර රක්ෂණ ගාස්තු ගිණුම [රක්ෂණ ගාස්තු ගිණුමේ රු.900ක් වැඩිපුර සටහන් වීමේ වරද නිවැරදි කිරීම]	900	900	(01)
	ලී බඩු අලුත්වැඩියා ගිණුම හර ලී බඩු ගිණුම [ලී බඩු අලුත්වැඩියා වියදම ලී බඩු ගිණුමට හර කිරීමේ වරද නිවැරදි කිරීම]	5 000	5 000	(01)
	ණය ගැති ගිණුම හර අවිනිශ්චිත ගිණුම [ණයට විකුණුම් ණය ගැති ගිණුමට හර නොකිරීම නිවැරදි කිරීම]	5 900	5 900	(01)

(ජර්නල් සටහනකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(2) අවිනිශ්චිත ගිණුම

	රු.		රු.
ශේෂය	5 000 (01)	ණයගැති ගිණුම	5 900 (01)
රක්ෂණ ගාස්තු	900 (01)		
	5 900		5 900

(ලකුණු 03යි)

(3) රන්සිරි ව්‍යාපාරය
2012.12.31 දිනට ශේෂ පිරික්සුම

	රු.	රු.
ප්‍රාග්ධනය		500 000
තොගය 2011.04.01	60 000	
ගැණුම්	357 000 (½)	
විකුණුම්		430 000
වේතන	45 000	
ලී බඩු	65 000 (½)	
ලී බඩු අලුත්වැඩියා	5 000 (½)	
රක්ෂණ ගාස්තු	4 100 (½)	
ඉඩම් හා ගොඩනැගිලි	280 000	
ණය ගැතියෝ	55 900 (½)	
ණය හිමියෝ		22 000 (½)
මුදල්	80 000	
	952 000	952 000

(ලකුණු ½ × **6 = 03**)
(මුළු ලකුණු 10)

6 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

6 වන ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය



ප්‍රස්තාරය 17

6 වන ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 63%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 18%ක් ද, හා
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 30%ක් ද, වශයෙන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 30%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 35%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.



ප්‍රස්තාරය 18

මෙම ප්‍රශ්නයෙහි ඇති කොටස් 3න් 2 කොටසෙහි පහසුතාව 66%ක් වන අතර 3 කොටසෙහි පහසුතාව 44%කි.

6 වන ප්‍රශ්නයේ (1) කොටස හා (2) කොටස සඳහා අපේක්ෂකයින්ගෙන් 65%ක් නිවැරදි ව පිළිතුරු සපයා තිබුණි. ගිණුම්කරණයේ දී සිදුවන වැරදි නිවැරදි කිරීම පිළිබඳ ව හා අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම පිළිබඳ ව සිසුන් තුළ තිබූ නිවැරදි දැනුම හා අවබෝධය මෙයින් පෙන්නුම් කෙරේ. කෙසේ නමුත් තවදුරටත් අභ්‍යාසවල යෙදවීම තුළින් මෙම සාධන මට්ටම ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ව ඇත.

මෙම ප්‍රශ්නයේ (3) කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ පෙනී සිටි අපේක්ෂකයින්ගෙන් 44%ක් පමණ වේ. ඒ අනුව පෙනී යන්නේ ගිණුම්කරණයේ දී සිදුවන වැරදි න්‍යායාත්මක ව හඳුනා ගත්ත ද එම වැරදි නිවැරදි කළ පසු නිවැරදි ශේෂ පිරික්සුම පිළියෙල කිරීම සම්බන්ධ දැනුම ඉතා අඩු බවයි. එම නිසා මෙවැනි ප්‍රායෝගික තත්ත්ව, අභ්‍යාස තුළින් සිසුන්ට වටහා දීම අවශ්‍ය ව ඇත.

7 ප්‍රශ්නය

7. දිල්කිගේ ව්‍යාපාරයේ 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ප්‍රාග්ධනය		600 000
බඩු තොගය (2011.04.01 දිනට)	20 000	
ගැනුම්	100 000	
විකුණුම්		120 000
ණය ගැතියෝ	30 000	
ණය හිමියෝ		44 000
12% බැංකු ණය		15 000
ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට)	400 000	
යන්ත්‍ර (පිරිවැයට)	200 000	
ආපසු එවුම්	1 500	
ආපසු යැවුම්		3 000
ලැබූ ගෙවල් කුලී		15 500
වරිපනම්	4 000	
රක්ෂණය	5 000	
සේවක වේතන	20 000	
ප්‍රචාරණය	2 000	
අතැති මුදල්	15 000	
	797 500	797 500

(ලකුණු ½ × 12 = 06)

අමතර තොරතුරු :

(i) 2012.03.31 දිනට බඩු තොගය රු. 25 000.

(ii) යන්ත්‍ර 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.

(iii) දිල්කි තම ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ලබා ගත් රු.4 000 ක භාණ්ඩ තොගය පිළිබඳ කිසිදු සටහනක් තබා නැත.

අවශ්‍ය වන්නේ,

(1) 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිල්කිගේ ව්‍යාපාරයේ වෙළඳ හා ලාභාලාභ ගිණුම

(2) 2012.03.31 දිනට ශේෂ පත්‍රය

(මුළු ලකුණු 10 යි)

7. (1)

දිල්කි ව්‍යාපාරය
2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
වෙළෙඳ හා ලාභාලාභ ගිණුම (½)

	රු.	රු.		රු.	රු.
2011/04/01 තොගය		20 000			
+ ගැනුම්	100 000		විකුණුම්	120 000	
- ගැනිලි	4 000 (½)		- ආපසු එවුම්	(1 500) (½)	118 500
	96 000				
- ආපසු යැවුම්	(3 000) (½)				
		93 000			
		113 000			
- 03/31 තොගය		(25 000) (½)			
විකුණුම් පිරිවැය		88 000 (½)			
දළ ලාභය ප/ගෙ		30 500 (½)			
		118 500			118 500
පරිපාලන වියදම්			දළ ලාභය		30 500
යන්ත්‍ර ක්ෂය	20 000 (½)		ලද ගෙවල් කුලී		15 500
වරිපනම්	4 000		ශුද්ධ අලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කලා		(½) 6 800
රක්ෂණය	5 000				
සේවක වේතන	20 000	49 000 (½)			
බෙදාහැරීමේ වියදම්					
ප්‍රචාරණය	2 000	2 000 (½)			
මූල්‍ය හා වෙනත් වියදම්					
ණය පොලී	1 800	1 800 (½)			
		52 800			52 800

(ලකුණු ½ x 12 = ලකුණු 06 යි)

(2)

දිල්කි ව්‍යාපාරය
2012.03.31 දිනට ශේෂ පත්‍රය (½)

			ජංගම නොවන වත්කම්	පිරිවැය රු. (½)	සමුච්චිත ක්ෂය රු.	ශුද්ධ අගය රු.
ප්‍රාග්ධනය	600 000					
- ශුද්ධ අලාභය	(6 800) (½)					
	593 200		ඉඩම් හා ගොඩනැගිලි	400 000	--	400 000
- ගැනිලි	(4 000) (½)		යන්ත්‍ර	200 000	20 000 (½)	180 000
		589 200		600 000	20 000	580 000
			ජංගම වත්කම්			
දිගු කාලීන වගකීම්			2012.03.31 තොගය		25 000 (½)	
12% බැංකු ණය		(½) 15 000	ණය ගැතියෝ		30 000	
			මුදල්		15 000	70 000
ජංගම වගකීම්						
ණය හිමියෝ	44 000					
උපචිත ණය පොලී (½)	1 800	(½) 45 800				
		650 000				650 000

(ලකුණු ½ x 08 = ලකුණු 04)
(මුළු ලකුණු 10 යි)

7 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රස්තාරය 19

7 වන ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 71%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 25%ක් ද, හා
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද, වශයෙන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 32%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 23%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.



ප්‍රස්තාරය 20

මෙම ප්‍රශ්නයෙහි කොටස් 2ක් ඇති අතර 1 කොටසෙහි පහසුතාව 63%ක් ද 2 කොටසෙහි පහසුතාව 61%ක් ද වේ.

මෙම ප්‍රශ්නය "මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම" යන නිපුණතා මට්ටම ඇසුරින් සකස් කර තිබුණි. මෙය අපේක්ෂකයින්ගෙන් 71%ක් තෝරා ගෙන තිබුණු අතර ඒ අනුව වැඩිම පිරිසක් තෝරාගත් ප්‍රශ්නය වේ. (1) කොටසෙහි පහසුතාව 63%ක් වන අතර (2) කොටසෙහි පහසුතාව 61%ක් වේ.

ගුරු-සිසු දෙපාර්ශවයට මෙම ප්‍රශ්නයට අනිවාර්යයෙන් සූදානම් වීමේ තත්ත්වයක් තිබීම නිසා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන් වැඩි ක්‍රියාකාරකම් සංඛ්‍යාවක නිරත කර වීම ඉහළ සාධන මට්ටමට හේතු වී ඇත.

මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා සකස් කරන වෙළඳ ගිණුම පිළියෙල කිරීමේ දී අතිරේක තොරතුරක් වශයෙන් සපයා තිබූ භාණ්ඩ ගැනිලි නොසලකා හැරීමෙන් විකුණුම් පිරිවැයට හා දළ ලාභයට හිමිවන ලකුණු ලබාගැනීමට නොහැකි වී ඇත.

මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීමේදී ලාභාලාභ ගිණුමට අදාළ අමතර තොරතුරක් වශයෙන් සපයා ඇති යන්ත්‍ර ක්ෂය හා ශේෂ පිරික්සුම තුළින් අනාවරණය කරගත යුතු බැංකු ණය පොළී ඇතුළත් නොකිරීමෙන් නිවැරදි **ශුද්ධ අලාභය** ගණනය කර ගැනීමේ අවස්ථාව මඟහැරී තිබිණ. එසේම ප්‍රායෝගික තත්ත්වය තුළ දී ව්‍යාපාර ලාභ මෙන් ම අලාභ ද ලබන බව ක්‍රියාකාරකම් මගින් අවබෝධ කර දී නොතිබීම අඩුපාඩුවකි.

බැංකු ණය පොළිය කෙරෙහි අවධානය යොමු නොකිරීම නිසා ශේෂ පත්‍රයේ දී ජංගම වගකීම් යටතේ හිමිවිය යුතු ලකුණු ද ගිලිහී තිබිණ. එසේම වෙළඳ හා ලාභාලාභ ගිණුමත් ශේෂ පත්‍රයත් නම් කිරීමේ දී නිවැරදි ශීර්ෂ නොයෙදීම ද ලකුණු අඩුවීමට හේතු විය. 11 ශ්‍රේණිය පෙළපොතෙහි නිදසුන්, ක්‍රියාකාරකම්වල ක්‍රමානුකූල ව අපේක්ෂකයින් යෙදවීමත්, විධිමත් ආකෘතියක් යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හුරුකරවීමත් තුළින් මෙම නිපුණතා මට්ටම වර්ධනය කරගත හැකි ය.

2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 21

ඉහත ප්‍රස්තාරයට අනුව ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයේ පහසුතාව ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයට වඩා 3%කින් වැඩි වී ඇත.

විෂය නිර්දේශයට අදාළ සියලු නිපුණතා නියමිත කාලසීමාව තුළ දී ආවරණය කිරීමත්, එක් එක් නිපුණතාවට අදාළ ක්‍රියාකාරකම් හා පැවරුම්වල යෙදවීමත්, ඒවා ඇගයීමට ලක්කිරීමත්, ප්‍රතිපෝෂණය ලබාදීමත් තුළින් අපේක්ෂකයින්ගේ සාධනය ඉහළ මට්ටමකට රැගෙන ඒමේ හැකියාව ඇත.

III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් සැලකිලිමත් විය යුතු කරුණු :

* පෙර සූදානමක් සහිත ව නියමිත වේලාවට කලින් විභාග ශාලාවට පැමිණිය යුතු ය.
* පිළිතුරු සැපයීමට අවශ්‍ය දෑ පමණක් විභාග ශාලාවට රැගෙන යා යුතු ය.
* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම්ගත යුතු ය. එනම් එක් එක් කොටසින් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව, අනිවාර්ය ප්‍රශ්න සංඛ්‍යාව, ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය, එක් එක් ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. තවද ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය.
* අයදුම්කරුගේ විභාග අංකය පිළිතුරු පත්‍රයේ සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.
* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්නයේ කඳ අවධාරණයෙන් යුතු ව කියවා වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය. තවද බහුවරණ පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව **එක්** කතිර ලකුණක් පමණක් යෙදිය යුතු ය.
* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී අදාළ ප්‍රශ්න අංකයට අදාළ ව තෝරාගත් වරණය බහුවරණ පිළිතුරු පත්‍රයේ ද එම අංකයට ම නිවැරදි ව සලකුණු කළ යුතු ය.
* II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* ප්‍රශ්න පත්‍රයෙහි සඳහන් ආකාරයට ප්‍රශ්න අංක හා අනුකොටස්වල අංක හා අක්ෂර නිවැරදි ව පිළිතුරු පත්‍රයේ ද ලිවිය යුතු ය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරු හා ඉලක්කම්වලින් පිළිතුරු ලිවිය යුතු ය.
* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකළ යුතු අතර, විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය.
* ප්‍රශ්නයේ සඳහන් කර ඇති ආකාරයට අනුව තර්කානුකූල ව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.
* පිළිතුරු ලිවීම සඳහා නිල් හෝ කළු පෑනක් භාවිත කළයුතු අතර, පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකළ යුතු ය.
* විභාග කාලය තුළ දී විභාග ශාලාධිපතිගේ උපදෙස්වලට අනුව විනයගරුක ව කටයුතු කළ යුතු ය.

විශේෂ උපදෙස් :

* ප්‍රශ්න තෝරා ගැනීමේ දී අනිවාර්ය ප්‍රශ්නයට පිළිතුරු සැපයිය යුතු අතර, ඒ ඒ විෂය ක්ෂේත්‍රවලින් තෝරාගත යුතු ප්‍රශ්න නියමිත පරිදි තෝරා ගත යුතු ය.
* ප්‍රශ්න පත්‍රයේ සඳහන් නියමිත ප්‍රශ්න ගණනට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර, අමතර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් වැළකී සිටිය යුතු ය.
* පිළිතුරු සැපයීමට ලබා දී ඇති කාලය අනුව එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ගත කළ යුතු කාලය හා එයට හිමි ලකුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
* ප්‍රශ්නවලට අදාළ පිළිතුරු පමණක් ලිවීම කළ යුතු අතර අනවශ්‍ය තොරතුරු ලිවීමෙන් වැළකී සිටිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට අදාළ කොටස් හා අනුකොටස්වලට අදාළ පිළිතුරු එකට සිටින සේ අමුණා තැබිය යුතු ය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

- ගුරුවරයා විෂය නිර්දේශයට අදාළ විෂය කරුණු පිළිබඳ ව දැනුවත් වීම හා යාවත්කාලීන වීම.

- සිසු නිපුණතා ගොඩනැඟීමට හැකිවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ආශ්‍රිත ක්‍රියාවලිය සැලසුම් කිරීම.

- හැකි සෑම අවස්ථාවක ම ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කිරීමට උත්සාහ කිරීම.

- නිපුණතා පාදක විෂය මාලාව තුළ සෑම සිසුවකු ම අඩු තරමින් ආසන්න ප්‍රවීණතාව කරා ළඟා කරවීමට ගුරුවරයාගේ අවධානය යොමු කිරීම.

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයට අදාළ ව කාලීන තොරතුරු පැවරුම් තුළින් එක්රැස් කිරීමට සිසුන් පෙළඹවීම.

- ගිණුම්කරණ අභ්‍යාසවල නිරතවීමේ දී ප්‍රශ්නයට හිමිවන ලකුණ මත නියමිත කාලය තුළ පිළිතුර සම්පූර්ණ කිරීමට සිසුන් හුරුකරවීම.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී දැනුම ලබා දීමට පමණක් සීමා නොවී සිසු චින්තනය අවදි කිරීමටත් සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමටත් කටයුතු කිරීම

- දන්නා දෙයින් නොදන්නා දෙයටත්, සරල දෙයින් සංකීර්ණ දෙයටත්, සංයුක්ත දෙයින් වියුක්ත දෙයටත් සිසුන් ගෙනයාම සඳහා ගුරුවරයා කටයුතු කිරීම.

- සිත් ගන්නා සුළු ආරම්භයක් සහිත ව ක්‍රියාකාරකම්වලට ප්‍රවේශ වීම හා අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම.

- පන්තිකාමරයෙන් බැහැර ව ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කර දීම.

- කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් ස්වයංවිනය, අන්‍යයන්ට සවන් දීම, අන්‍ය මත ඉවසීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනොවුන්ට උපකාර කිරීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වන වැදගත් කුසලතා සංවර්ධනය කර ගැනීමට සිසුන්ට ඉඩකඩ සලසා දීම.

- සිසුන් තුළ ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සංවර්ධනය කර ගැනීම සඳහා බැංකු, සන්නිවේදනය, ආයතන, කර්මාන්ත ශාලා ආදිය නැරඹීමට ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.

- නියමිත කාලසීමාවන් තුළ විෂය නිපුණතා මට්ටම් නිම කිරීම, අතිරේක අභ්‍යාසවල යෙදවීම සහ ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණය සිසුන්ට ලබා දීම.

- අවශ්‍ය අවස්ථාවල දී ක්ෂේත්‍ර චාරිකා, අන්තර්ජාල පරිශීලනය, අතිරේක පොත්පත් කියවීම යනාදිය තුළින් සිසුන්ගේ විෂය දැනුම පෝෂණය කිරීම.